# ඉලන්දාරියෙකුගේ අඳෝනාව

# නරලොව හොල්මන්

Copyright © by

චන්ද්‍ර අනගිරත්න

1965 - 1967



IGCAS www.sinhalamp3.com e Story Book's

ඉලන්දාරියෙකු වශයෙන් මානුෂික අයිතිවාසිකම් සම්පුර්නයෙන්ම භුක්ති විඳීමට නම් ඔබ ජිවත් විය යුත්තේ සම්පුර්ණයෙන්ම ගෙදරින් පිටය. එසේ නැතිව, දෙමව්පියන්ගේ පාලනයට යටත්ව ඔවුන් සමග ගෙදර ජිවත් වන ඉලන්දාරියෙකුට නිරායාසයෙන්ම ලැබේන්නේ ලම්ස්සියක මෙන් කාලය ගෙවීමටය.

මෙය එතරම් සතුටුදායක තත්වයක් නොවේ. හයහතර නොතේරෙන කාලයේත්, යමක්-කමක් හම්බකර ගැනීමට නොහැකි කාලයේත් දෙමව්පියන් කියන දෙයක් අහගෙන ගොනා සේ කරබාගෙන ගෙදරට වී හිටියාට, මං කියන්නේ, දෙයියන්නෙ පිහිටෙං රක්ෂාවක් කරගෙන තුට්ටුවක්-දෙකක් අතට ලැබෙන කොටත් අම්මා තාත්තා කියන හැටියට වැඩ කරන්න පුළුවන්ද? අවුරුදු හත අටක් ගමෙන් පිට ගොස් නිදහස් ජිවිතයක් ගත කර ඇති මට දැන් ගම් පලාතට වී රක්ෂාව කිරීමට සිදු වී ඇති නිසා ලැබී ඇත්තේ දෙමව්පියන්ගේ දරදඩු පාලනයට යටත්ව සිටීමේ අවාසනාවන්ත තත්වයකි.

අම්මා හිතා සිටින්නේ මා තවම කිරි බොන පොඩි එකකු කියාය. එහෙත් මට නිතරම ලැබෙන්නේ නිකං තේ ය. පුංචි දවස්වල අහල පහල කෙල්ලන්-කොල්ලන් සමග ස්ත්‍රි-පුරුෂ භේදයකින් තොරව සෙල්ලම් කිරීමට ඉඩ දුන් අම්මා දැන් නිතරම බයෙන් පසුවන්නේ මා නිසා පිට අය නරක් වේය කියාය. කෙසේ වුවද, ගෙදරට පෝලිමේ එන මගුල් කපුවන්ට මගෙ විස්තර කියා දීමේ දී අම්මා මගේ සැබෑ තත්වය කොතෙක් දුරට වෙනස් කරන්නේද කියතහොත්, මා වෙන කෙනෙකු දැයි මටම සැකය.

මගේ කේන්දර කොපිය අම්මාගේ භාරකාරත්වය යටතේ තිබීම මට මහත් අපල දායකය. මෙය මගේ භාරයට ගැනීම සඳහා අවශ්‍යකමක් මට ඇතැත්, ප්‍රශ්නයක්ව ඇත්තේ ඊට නිදහසට කරුණු ඉදිරිපත් කිරීමය. අනෙක් අතට, කේන්දර කොපිය අම්මා ලග තිබුණොත් සල්ලි කදක් සමග තාර පීප්පයක් ලබාගැනීමේ වාසනාවක් මට උදා වනු ඇත. ඒත් කමක් නෑ, කරන දෙයක් අර අදින්නේ නැතිව ඉක්මන් කරනව නම්.........

තාත්තා ගෙදර සිටන නිසා දවසකට දහ-දොළොස් පාරක් වැසිකිළියට යාමට මට සිදු වී ඇත්තේ සිගරට් පානය කිරීමටය. තාත්තා ඉදිරියේ මා සිගරට්

නොබොන්නේ තාත්තාට ඇති බයකින් නොවේ; මට සම්පූර්ණයෙන්ම සිගරට් එක බොන්නට ඉඩ නොදී තාත්තා සිගරට් කොටය ඉල්ලා ගන්නා නිසාය.

මා අරක්කු බොතලයක් ගෙදර ගෙනවිත් තැබුවොත් තාත්තාට නිතරම බඩේ කැක්කුම හැදේ. බඩේ කැක්කුමට හොඳම ඖෂධය ඉගුරු බව අම්මා ප්‍රකාශකරතත්, අරක්කු බෝතලය හිස් වන තෙක් තාත්තා අම්මාගේ කීම පිළිනොගනී.

මා අරක්කු බෝතලය මගේ කාමරයේ පෙට්ටි හතකට යටින් ඇති පොත් පෙට්ටියේ සගවා තැබුවත් මා නොදැනුවත්වම සියයට අනූහතහාමාරක් එයට වතුර එකතු වේ. ඒ සම්බන්ධයෙන් මට බහිරවයා සැක කළ නොහැක්කේ ඌ අරක්කු බොන බවක් මෙතෙක් ඔප්පු වී නැති නිසාය.

මැග් වැඩ කට යුතු ගැන තාත්තාගේ කිසිම පැහැදීමක් නැතත්, මා වැඩ අවසන් වී ගෙදර එම තෙක් තාත්තා බලා සිටින්නේ රේස් කොළය ඉල්ලා ගැනීමටයි.

එහෙත් මට මහත්ම කරදරයක්ව ඇත්තේ දිනන අශ්වයන් තෝරා තාත්තාට ටිප් එක දීමය.

ගෙදර සිට පිට කෙල්ලන්ට ලියුම් ලිවීමද පහසුවක් නැත. මා පෙම්හසුනක් ලිවීමට පටන් ගත්තොත් අයියා හෝ මල්ලී හෝ එය කොපි කිරීමට ඉඩ ඇත. මට පෙම් හසුනක් ලැබුනොත් අක්කා හෝ නංගී හෝ කොපි කිරීමට ඉඩ ඇත. මුලදී කෙල්ලන්ගෙන් ලැබුනු ලියුම් කිහිපයක්ම මට හොරෙන් විවෘත කර ඇති අම්මා ඔවුනට පිලිතුරු සැපයීමේ භාරදූර කර්තව්‍යයද තමන් අතට ගත් නිසා - අනේ අප්පෝ - දැන් එක කෙල්ලක් හෝ මගේ මුහුණ නොබලන හැටි! අනෙක් අතට, පිටස්තර කෙල්ලන් මගේ සහෝදරියන් ලෙස පිටස්තර අයට හඳුන්වාදීමට පුරුදු මා එවැනි හැඳින්වීමක් ගෙදර අයට කළ විට ගෙදර කවුරුවත් මගේ කීම පිළිනොගන්නා හැටි!.

ගමෙන් පිට සිටියදී මා නොයෙකුත් ගමන් - බිමන් වල යෙදුණේ ගෙදර යන බවක් නවාතැනේ ඇත්තන්ට අඟවාය. එහෙත් දැන් ගෙදර යන බවක් පවසා ගෙදරින් පිට වන විට අම්මා මා අවිශ්වාස කරයි. මට ලැබෙන වැටුප නිතරම නියම ප්‍රමාණයට වඩා අඩුවෙන් පෙන්වා සිටීමට තරම් නිහතමානී ගතියක් ඇති මා නිතරම ගෙදරට පවසන්නේ " මේ මාසයේ පඩි තවම ලැබුණේ නැහැ," කියාය. එමෙන්ම අම්මා මගෙන් අසන්නේ " ඇ, පුතේ, උඹට පඩි හම්බු වෙන්නෙ අවුරුද්දකට එක පාරද?" කියාය. මගේ නියම වත්කම නිතරම අඩුවෙන් පෙන්වා සිටීමට මා උත්සාහ දරතත්, ආදායම් බදු දෙපාර්තුමේන්තුවට වඩා හපන් කමක් දක්වා මගේ කමිස සාක්කු සහ කලිසම් සාක්කු පරීක්ෂා කර බදු අයකිරීමට  අපේ අම්මාට පුළුවන.

කන්තෝරුව පටන් ගන්නේ උදේ 9:00ට වුවද, මා ගෙදරින් පිටත් විය යුත්තේ පාන්දර පහටය. පාසල් ශිෂ්‍යාවන් සහ ගුරුවරියන් ගමන් ගන්නා බසයක ගමන් කිරීමට අම්මා මට ඉඩ නොදෙන්නේ අලුත් අධ්‍යාපන ධවල පත්‍රිකාවටද පටහැනිවය.

සාර්ථය විවාහ ජීවිතයක් ගතකිරීමට අනාගතයේදී මට අවස්ථාවක් සලසා දීමට කියා, මා ගෙදර සිටින හැම අවස්ථාවකම අම්මා මා කුස්සියට කැඳවා, පොල් ගෑමටත්, මිරිස් ඇඹරීමටත්, පිඟන් හා හැළිවලං සේදීමටත් පුරුදු කරන නමුත්, තම්බන ලද අර්තාපල් අලවල පොතු ගැලවීමට හෝ උම්බලකඩ කැපීමට හෝ කිසිම අවස්ථාවක ඉඩ නොදෙයි. මේක හැබෑ නීතියක් නේ!.

කරුණු මෙසේ බැවින්, දැන් මට ගෙදර සිටින එක තිත්ත වී ඇත. ගෙදරින් පිටවීමට තරම් හිතක් දැන් මට ඇත. ඒ සඳහා මා අමුතුවෙන් මහන්සි විය යුතු නැත. මෙම ලිපිය පත්තරේ පල වූ පසු මට නිකම්ම ගෙදරින් යන්නට සිදු වනු ඇත. එහෙම වුණොත් මා කොහේ යන්නද? ඒ නිසා, අද අපේ ගෙදරට පත්තරේ නොලැබෙන්නට පත්තරකාරයාගේ බයිසිකලේ කැඩුනොත්...මහනුවරට පත්තරේ ගෙන එන වෑන් එක අතරමගදී කැඩුනොත්........පත්තරේ කර්තෘ මැරුණොත්..........

**නිමි.**

Visit http://www.sinhalamp3.com - for more sinhala e stories

# ඉස්පිරිතාලේ දොස්තර නෝනට ලණුවක්

## නරලොව හොල්මන්

Copyright © by

**චන්ද්‍ර අනගිරත්න**

**1965 - 1967**



IGCAS www.sinhalamp3.com e Story Book's

මා සාමාන්‍යයෙන් බෙහෙතක් පාවිච්චි කරන්නේ ශරීරයේ යම්කිසි අසනීපයක් ඇත්නම් පමණි. එහෙත් මා බෙහෙත් ගැනීම සඳහා රජයේ ආරෝග්‍ය ශාලාවකට හෝ ඩිස්පැන්සරියකට යන්නේ හොඳ සනීපයෙන් සිටින අවස්ථාවල පමණි. මන්ද – මහ සෙනග අතරේ තෙරපී, පොරකමින්, වරු ගණන් පෝලිමේ ඉඳ, බෙහෙත් ලබා හැක්කේ ශරීර සෞඛ්‍ය යහපත් අයට මිස අසනීපකාරයන්ට නොවන හෙයිනි. කෙසේ වුවද, මෑතකදී ඇති වූ දොස්තර හබය නිසා, ලෙඩාට ඇති වන තරම් හෙමින් ලෙඩ බැලීමට දෙස්තර වරුන් කාරුණික වීමත්, අපේ ආරෝග්‍ය ශාලාවේ බාහිර දොස්තර අංශයට දොස්තර නෝනා කෙනකු ලැබීම නිසා "ආරෝග්‍යා පරමා ලාභා" බව මට වැටහුණි.

" මොකද අසනීපෙ?" දොස්තර නෝනා අසුවාය.

"කකුල් දෙක රිදෙනවා හරියට –"

"හුගක් කල් ඉඳන් ද?"

"නෑ – මේ උදේ ඉඳන් පොලිමේ ම ඉඳලා –"

"මේහාට ආවට  පස්සේ හැදෙන ලෙඩ නෙවේ – මෙහාට එනකොට තිබුන ලෙඩේ මොකක් ද?"

මට කිසිම අසනීපයක් නැති බව වැටහුනේ මෙවිටය. මම කල්පනා කරන්නට වීමි.

"ලැජ්ජවෙන්ට එපා – තියෙන දෙයක් කියන්න?"

"මට තියෙන්නේ – " මම අදි–මදි කෙලෙමි.

"ඔව් – ඔව් – මොකක්ද?"

"මට නෝනට කියන්න මොකක්ද වගේ –"

"මොකෝ – නරක ලෙඩක් ද?"

"ආයෙ නරක ලෙඩ – හොඳ ලෙඩ කියල ජාතියක් තියෙනව ද? ලෙඩේ කොකත් නරකයි!" මම හරස් වුවේමි.

"මං ඇහුවේ නරක තැනකද කියලා –"

"ආයේ නරක තැන හොඳ තැන කියලා –"

"හා – හා – කොහෙ හරි කමක් නෑ – මොකද අමාරුව? ලගට එන්න!"

මම ඇයට ළංවිමි.

"මේක හැදුනම කන්ට බෑ – බොන්ට බෑ – ගමන් යන්ට බෑ

"නාන්ට?"

"නාන්න පුලුවන්, හැබැයි සබන් ගාන්න අමාරුයි!"

"ඉස්සරෝම අමාරුව දැනෙන්නේ කොහාටද?"

"ඉස්සරෝම අතට - ඊලගට කටට - ඊලගට බඩට - ඊලගට පපුවට, ඉතින් මේ අමාරුව හැදුණම ජීවිතේම එපා වේනවා - අමාරුව හැදුණම නෑදෑයෝ, මිත්තරයො වුණත් කිට්ටු වේන්නේ නෑ."

"බෝවෙන ලෙඩක් වේන්න ඇති!"

"ඔව්, නෝනා - මේ අමාරුව හැදුනම අහන අහන එකා කියන්නේ 'මටත් ඔය අමාරුව තියෙනව!' කියලයි."

"ඔහේ කසාද බැදලද?"

"මං නං තවම නෑ - නෝනා බැදල ද?"

"මං බැන්දද නැද්ද කියලා ඔහේට වැඩක් නෑ - ඔහේ බැදලද?"

"මුලදී නං අදහසක් තිබුනා - මේ අමාරුව හින්දා කසාද බදින්න බයයි."

"යං කාමරේ අතුලට!" කියා දොස්තර නෝනා පුටුවේන් නැගිට දොර ලගට ගියා ය. මා දොර ලගට ගියේ කෝඩු ගතියෙනි. "ඇතුලට එනවා"

"කව්රුත් නැතිව නෝනයි, මායි කාමරේ ඉන්න කොට මිනිස්සු මොනවා හිතයිද?"

"පිස්සු නැතුව එනවා!"

මම බයෙන් ඇතුලු විමි.

"ඇදට නගින්න!"

"මට බයයි නෝනා - මං බොහොම පිරිසිදු -"

"පිස්සු නැතුව නගිනවා!" කියා ඇය ඉල්ලා සිටි පසු මම ඇදේ දිගා විමි. ඈ මගේ දිව , උගුර, බෙල්ල සහ අත් පරීක්ෂා කළාය.

"කමිසේ ගලවන්න!" යැයි ඇය ඉල්ලා සිටි විට මම හරස් විමි. "කමිසේ ගැලැව්වට අමාරුව හොයාගන්න බෑ නෝනා!" මම කමිසය ගැලවීමි.

" ඔහේ මට උගන්වන්න හදනව ද?" කියා ඇය මගේ පපුව හා පිට සෝදිසි කර බලද්දී මම දගලන්නට විමි.

"ඔහේගෙ අමාරුව තියෙන්නේ පපුවේ?"

"නෑ නෝනා - මං දැගලුවේ මට හරියට කිති!"

"එහෙම නං ඔහේට ඇති අමාරුවක් නෑ - යන එකයි තියෙනනේ -"

"එහෙමනං මං දෙපාර්තුමේන්තුවට රිපෝට් කරනව - මගේ ලෙඩ බැලුවෙ නෑ කියල - " මම යන්න සුදානම් විමි.

"ඔහෙම ඉන්ට - යන්ට එපා - මේ අමාරුව හැදිලා හුගක් කල් ද?

"ඉස්කෝලෙ යන කාලේ තිබුනා - ඊට පස්සෙ ඔන්න රස්සාවකට යන කාලේ අමාරුව අඩුවුණා. ඔන්න රස්සාවෙන් අස්වේලා ගෙදර ඉන්නකොට ආයෙත් හැදුනා"

"පවුලේ වෙන කාටත් මේ අමාරුව හැදිලා තියෙනව ද?"

"අපේ තාත්තට හැදිල තියෙනවා - කසාද බැඳපු අලුත."

"ඊට පස්සේ"

"ඊට පස්සෙ - යුද්ධ කාලෙ අමාරුව හැදිල තියෙනවා."

"මේක පරමාණු ලෙඩක් නේ! ඉතිං ඉතිං!"

"අපෙ අම්මට මං ලැබිච්ච දවස්වල මේ අමාරුව හැදිලා තියෙනවා."

"කාට ද - අම්මට ද?"

"නෑ - තාත්තට"

"මේක හැබෑ ලෙඩක්නේ!" කියා ඈ කල්පනා කරන්නට වී යළිත් මා දෙසට හැරුනාය. "ගලවන්ට කලිසම"

මම දොස්තර නෝනාද පෙරළාගෙන එලියට පැන්නෙමි. එහෙත් දොරට එහායින් සිටි කංකානම්ලා දෙදෙනෙක් මගේ අත් දෙකින් අල්ලාගෙන ඇදගෙන වුත් මා යළිත් දොස්තර නෝනා අභිමුකයේ හිටවූහ.

"ගලවන්ට කලිසම"

"කලිසම ගැලෙව්වට මගේ අමාරුව හොයාගන්න බෑ නෝනා! මම පිංසෙණ්ඩු වීමි.

"කරන්න දෙයක් නෑ අපට කියලා තියෙන්නේ ලෙඩ්ඩු හොඳට හෝදිසි කරන්න කියලයි. ලෙඩක් ඇතත් නැතත් කලිසම ගලවන්ටම ඔනේ - නැත්තං මගේ වැඩ තහනම් කරන්නත් පුළුවන්."

"මට ලැජ්ජයි!"

"ඔහේගෙ ලැජ්ජාව වගේ නෙවේ - මගේ රස්සාව!"

"මං කියන්නං මගේ අමාරුව මොකක්ද කියලා - "

"මොකක් ද?"

"මේක අපි කාටත් හැදෙන අමාරුවක් - ලොකු මිනිස්සු හින්දා තමා පොඩි මිනිස්සුන්ට මේක හැදෙන්නේ. එතකොට අපි වගේ දුප්පත් අය හින්දයි නෝනලා වගේ ලොකු අයට මේ අමාරුව හැදෙන්නේ නැත්තේ."

"ඔහේට තියෙන්නේ මානසික අමාරුවක්!"

"මානසික අමාරුවක් නෙමේ නෝනා - මානුෂික අමාරුවක් ලේසියෙන් හොඳ කරන්න බැරි අමාරුවක්."

"දොස්තර කෙනෙකුට පුලුවන් ඔන අමාරුවක් හොඳ කරන්ට - "

"හොඳයි මගේ අමාරුව හොඳ කරන්ට නෝනා පොරොන්දු වේනවද?"

ICCAS

"ඔව් - මොකක්ද ඔහේට තියෙන අමාරුව?"

"මට තියෙන්නේ මුදල් අමාරුව!"

"මුදල් අමාරුව?" ඈ ඇස් ලොකු කර අසුවාය.

"ඔව්"

"මුදල් අමාරුව හොඳ කරන්න බෑ අපිට"

"එහෙනං මං රිපෝට් කරලා නෝනාගෙ වැඩ තහනම් කරනව."

"එහෙනම් ඔහේගෙ කලිසම ගලවනවා!"

"මොකට ද?"

"සෝදිසි කරන්න."

"සෝදිසි කරන්න දෙයක් නෑ - මං මට තියෙන අමාරුව දැන් කියලා තියෙන්නේ."

"කීයක් ද ඔනේ?"

"රුපියල් දහයක්!"

"මටත් හුගාක් අමාරුයි!" ඈ කීවාය.

"එහෙනං මං සෝදිසි කරල බලන්නං -"

"නෑ - නෑ - සල්ලි තියෙනවා -" කියා ඈ මා අත රුපියල් දහයක් තබා මගේ අමාරුවට ප්‍රතිකාර කළා ය.

එහෙත් මා ඇගේ කාමරයෙන් එලියට ආ විට එතෙක් වෙලා පුපුරමින් පෝලිමේ සිටි සියලුම ලෙඩ්ඩු මා වටකර ගෙන ප්‍රතිකාර කිරීමට සැරසුණහ. එහෙත් කරුණාවන්ත කංකානම් මහත්වරුන් දෙදෙනා වහාම ඉදිරියට අවුත් මා ඔවුන්ගෙන් බේරාගෙන පස්ස දොරෙන් මා පිටත්කර හැරියේ රුපියල් දහයෙන් භාගයක් ද කඩා ගනිමිනි.

**නිමි.**

Visit http://www.sinhalamp3.com - for more sinhala e stories

**කෙල්ලක. සමග චිත්‍රපටි. බැලුවෙමි.**

# නරලොව හොල්මන්

Copyright © by
**චන්ද්‍ර අනගිරත්න**
**1965 - 1967**



IGCAS www.sinhalamp3.com e Story Book's

මා හඳුනා ගැනීම ඔබට එතරම් අපහසුවක් නොවේ. නයිලෝන් සම්සයත්, බම්බු හැඩයෙන් යුත් විනිලෝන් දිග කලිසමත්, පොළොව හැරීමට තරම් උල්ව ඇති යැන්කි සපත්තු කුට්ටමත්, දකුණු අතේ වැළමිටට ළංව බැඳ ඇති අත් ඔරලෝසුවත්, ගිනිපෙට්ටි හිගය ද නොතකා කළුපාට වී ඇති හීන් උඩු රැවුලත්, පොල් තෙල් සහ වතුර මිශ්‍රණයෙන් ගොඩනංවා ඇති කොණ්ඩේ බම්ප් එකත් නිසා මා රක්ෂාවක් නැති රස්තියාදුකාර පරපුරට අයත් මදාවිකාරයකු බව බැලූ බැල්මටම ඔබට වටහා ගත හැක. ඉදින් මා අඳුනා ගැනීමට යම් අපහසුවක් ඔබට ඇති වේතොත් ඇති වන්නේ, අව්ව වැස්ස වෙනසක් නොතකා පාන්දර 6-15 සිට රාත්‍රී 9-37 දක්වා මා පැලඳ සිටින සන් ග්ලාස් එක නිසාය.

ඉංගිසි කියවීමට තරම් දැනුම මා හට නැතත්, නිතරම ඉංගිසි පොතක් අතේ තබා ගෙන සිටීමට තරම් ශක්තියක් මගේ වම් අතේ ඇඟිලිවලට ඇත. පණ්ං හතරක් හම්බ කිරීමට පුලුවන් කමක් නැතත් , මහා විද්‍යාඥයකු මෙන් ගාම්භීර ලෙස සිගරට් එක කටට ලංකර නහයෙන් දුම් ඇරීමට මම සමත් වෙමි. යහලුවන් සමග හෝටලයකට ගොස් පැය ගණනක් කයිවාරු ගසමින් සිට වේටර්ට ශත විසි පහක් ටිප් එක වශයෙන් දීම මට සුළු දෙයකි. එහෙත් කුලියට පොල් කඩන අපේ තාත්තාටත්, පොල් අතු වියන අපේ අම්මාටත්, බිඩි ලේබල් අලවන අක්කාටත්, පිං පඩි ගන්න සීයාටත් ශත විසි පහ කියන එක ලොකු දෙයකි.

ගෙදර තත්වය සහ මගේ පෞද්ගලික තත්වය මෙසේ වෙතත්, වැදගත් ලොකු මිනිහෙකු මෙන් පෙනී සිටීමට මා උත්සාහය දරන්නේ කෙල්ලන් දැලේ දමා ගැනීම සඳහාය. මේ සඳහා ඉහත සඳහන පරිදි බස්වල නිතර නිතර ගමන් කිරීමත් , බාලිකා විද්‍යාලයන් අසල ගැවසීමත් බස් නැවතුම් පොලවල රස්තියාදු වීමත්, පෙරහැර, සන්දර්ශන, උත්සව, සැනකෙලි සහ ප්‍රදර්ශන එකක් නෑර නැරබීමත් නොවරදවාම මාගෙන් සිදු වන්නේ, හුදෙක් කෙල්ලන් දෙස බලාසිටීමට සහ අවස්ථාව ඇති විට ඔවුන්ගේ ඇගේ හැප්පීමට මා තුල අති බලවත් ආශාව නිසාය. මේ නිසා අපේ නගරය පිලිබඳව නගරාධිපතිටත් වැඩි ඇනුමක් මට ඇත. ඒ ඒ කෙල්ලන් පිලිබඳව උන්ගේ අම්මලලාටත් වැඩි දැනුමක් මට ඇත.

පසු ගිය පෝය දා පුරුදු පරිදි ඇඳ-පැලඳගෙන මම ගෙදරින් එලියට බැස්සෙමි. කිසිම බයක් සැකයක් නැතුව බස් එකේ කෙල්ලෙක් ලඟින් වාඩි වුයේ, පිටිකිරි ටින් එකක් ගෙන ඒම සඳහා අම්මා විසින් දෙන ලද රුපියල් දහය මගේ සාක්කුවෙන් ලෙල දෙමින් තිබුනු හැටි නයිලොන් රෙද්දෙන් පිලිබිඹු වූ බැවිනි. මම කමිස අත් ඉහල අකුලා අත් දෙක පලල් කලෙමි. ඉංග්‍රීසි පොත දිග හැරියෙමි. වංගුවකදී ඇගේ පැත්තට බරවීමි. පොතේ පිටුවක් පෙරලීමේ දී වැල මිට ඇගේ ශරීරයේ ස්පර්ශය ලැබුවේය. ඈ

කරබාගෙන සිටියාය. මම තවත් පිටුවක් පෙරලීමි. ඈ කතා නොකලාය. ඇගේ ශරීරයේ පිහිටීම අනුව මගේ වැලමිට සකස් කල මම තවත් පිටුවක් පෙරලීමි. ඇගේ මුහුණට යන්තම් සිනහවක් පහල විය. මම පොතේ පිටු පෙරලා ගෙන පෙරලා ගෙන ගියෙමි. ඈ මගේ මුහුන බලා හොර සිනාහවක් පහල කලාය. බස් එක ගැස්සෙන අනු තාලයට මගේ වැලමිටද ගැස්සුනි. බස් එකේ වේගයට වැඩි වේගයකින් පොතේ පිටු පෙරලිනි. පොතේ කතාව අවසන් විය. මම කතාව පටන් ගත්තෙමි.

"ඔයා කොයි ඉස්කෝලෙටද යන්නේ?"

"මං ඉස්කොලේ යන්නේ නෑ"

"ඇයි ඒ?"

"වැඩක් නෑ."

"එහෙම වැඩක් නෑ කියන්න එපා. ඉගෙනීම කෙච්චර වටිනා දෙයක්ද?"

"ඒ වුනාට අද පෝය දා ඉස්කෝල නිවාඩු නේ!"

"ආ, මං ඇහුවේ මේ...මේ...මේ...තවම ඉගෙන ගන්නවද කියලයි."

"ඔව්."

"කීයෙද?"

"උසස් පෙළ"

"සයන්ස් ද?"

"නෑ ආට්."

"චා... සයනස් කළා නං කොච්චර හොද ද?"

"ම්හ්..." කියා ඈ නිශ්ශබ්ද වුවාය. ඒහෙත් පාරේ වංගු නොතිබුනු බැවින් නිශ්ශබ්දව සිටීම මගේ වාසියට හේතු නොවීය. මම දෙවැනි පරිච්ජේදයට මුල පිරීමි.

"හරිම කම්මැලියි ගෙදට්ට වෙලා ඉන්න. හොද පිචෑර් එකකුත් නෑ..." කියා මම නළල රැලි ගැස්සිමි.

"ඇයි සිංහල එකක් ඇවිත් තියෙන්නේ...."

"මොකක්ද ?" මම නොදන්න බවක් ඇගවීමි.

"දළු බන්ඩා!"

"ඒක හොඳද?"

"හොඳයිලු."

"ඔයා කොහේද යන්නේ?"

"මාළිගාවට."

"මාළිගාව හැමදාමත් තියෙන දෙයක්. බයිස්කෝප් අද එනවා හෙට යනවා!"

"ඒ වුනාට මාළිගාවට සල්ලි ඔනේ නෑ"

"බයිස්කොපි වලටත් නෑ"

"අ...ඇයි නැත්තේ?"

"ඒක මං බලාගන්නංකො, මොකද කියන්නේ?"

"ගෙදර කට්ටිය මොනවා කියයිද....?"

"මොනවා හරි බොරුවක්. දන්නේ නැද්ද?"

"මං කියන්නං එහෙනං... හොඳ-ට අඳුරන...."

"අන්න හරි!" මට ඇති වූ ප්‍රිතිය නිම්හිම් නැති විය. ප්‍රිතියෙන් මගේ රස නහර පිනා ගොස් පිටාර ගලන්නට විය. බයිස්කොප් එක නිකන් ජේන්නා ජේන්නා වගේ විය. සිනමා ශාලාවේ පස්සේම ඇති ආසන දෙකක් ද, චිත්‍රපටිය ආරම්භයට පෙර සංගීතරාවයට අනුව ඇගේ ඇස් දෙක බලා බැලුම් හුවමාරු කර ගන්නා ආකාරයද, චිත්‍රපටිය ආරම්භ වු පසු අන්ධකාරයද, විවේකයේ චොකලට් කෑමද. මගේ සිහියට නැගෙන්නට විය. බසය නතර විය. මම බැස්සෙමි. ඇයද වට පිට බලා පස්ස නලවා ගෙන බසයෙන් බසිද්දී මම ඇයට ඇහෙන් සංඥා කෙළෙමි.

"ඉන්ට පොඩ්ඩක් අම්මා බහිනකං!"

"මොනවා! අම්මා?" මට චිත්‍රපටියට පෙර තරුපෙනේන්නට විය.එහෙත් අම්මලාගේ ඇස් වසා දුවලා රවුමෙ ගැන්ම ගැන මට බිය නොවීය.

"ඔව් - අම්මයි, තාත්තයි -"

"මොනවා දෙන්නම?" මට අකනිටා බ්‍රහ්ම ලොකයද පෙනුනි.

"නෑ දෙන්නා විතරක් නෙවෙයි. තව නංගිලයි, මල්ලිලයි, අක්කලයි, අච්චි, සීය, පුංචි අම්මගෙ දුවයි, නැද්දයි!"

"එහෙනං පිච්චර් බලංට හම්බුවෙන එකක් නෑ!"

"නෑ නෑ බය වෙන්ට එපා! ඒ කට්ටිය නැවිත් ඉන්න එකක් නෑ!" යනුවෙන් ඇය පවසද්දී, අගේ මව හා පියා විය යුතු දෙදෙනෙක්ද, නැද්දා යැයි කිව හැකි අම්මෙන්ඩියක් ද, හතුරෙකු දුටු පාබල හමුදාවක් මෙන් බසයෙන් බැස අප කරා ආවෝය.

"මේ අය බසයේ පසු පස අසුන් ගෙන සිටිනු මා ගනන් නොගත් අතර, මා සිතා සිටියේ මේ කෙල්ල තනියෙන් ගමන් කරන්නියක කියාය.

"අම්මේ, මේ මහත්තයා මං හොඳට අඳුරන එක්කෙනෙක්! බයිස්කෝප් බලංට යන්ද කියලා අහනව! යං නේද?"

"අනේ ඇත්තට! යං දුවේ, යං! මෙහෙම පිනක් බුදුන් ජීවමානව වැඩ උන් කාලෙවත් ලැබෙන්නේ නෑ. මං පෙරුම් පුර පුරා හිටියේ කවද්ද බයිස්කෝප් එකක් බලන්න යන්නේ කියලා. අනේ මහත්තයෝ ඔබට මයිත්‍රී බුදුන් දැක නිවන් දකින්ට ලැබේයි!" යැයි පැවසූ කෙල්ලගේ මව, අනෙක් අය දෙස බලා "මොකද උඹලා කියන්නේ? බයිස්කෝප්පෙක යනවද? නැත්තං ආපු ගමන යනවද?" කියා ඇසුවාය.

"බයිස්කෝප් බලන්ට යං! මාළිගාව වන්දනා මාන කරන්න කවදා යන්න බැයි ද!" පහලෙදස් දෙනෙකුගෙන් යුත් හැත්තෑ වරිගයම උත්තර දුන්හ. එක තැන හිටගෙන සිටීමට තරම් ශක්තියක් නෙතිබුනු මට ඉබේම ඇවිදිණි. මාර සෙනග මා පස්සෙන් ආහ. සප්තමහා සාගරයේ ජලප්‍රවාහයට අසු වූ පඩරුැලක් මෙන් මගේ සාක්කුවේ රුපියල් දහය කොයි අතට විනාශ වේදැ යි මම නොදත්තෙමි.

සිගරටයක් ගැනීමට යන ව්‍යාජයෙන් ඔනුන් සැම පාරේ නවත්වා කඩයකට ගිය මම සන්ග්ලාස් එක රුපියල් දහයකට විකුණා එලියට ආවෙමි. " මහත්තයා අපි උදේට තේ බිලා ආවේ නෑ!" යයි කෙල්ලගෙ මහා එකා සල්ලි දුටු හැටියේ පැවසූ පසු මම ඔවුනට ආහාර පාන සපයා ඒ අතරේ මගේ අත් ඔරලොසුව කඩේ මුදලාලිට විකුනා රුපියල් තිහක් ලබා ගත්තෙමි.

දෙවැනි පංතියේ ටිකට් අවසන් වී තිබූ බැවින් මට සිදු වුයේ දහ දෙනාටම පලමු පංතියේ ටිකට් මිලදී ගැනීමටය. සියල්ල ඉවසාගෙන මම කෙල්ල ලගින්ම වාඩි වුයෙමි. එහෙත් කෙල්ලගේ මව ඇය නැගිටුවා ඈත කෙලවර අසුනකට යවා මා ලගින්ම වාඩි වුවාය. ආච්චි මගේ අනිත් පැත්තෙන් වාඩි වුවාය. නිකං ඉන්න මට ඒත් කමක් නැතැයි කියා මා සුසුමක් හැරිය පසු. චිත්‍රපටිය ආරම්භවීම සදහා පහන් නිවෙන්නට විය. කෙල්ලගේ පියා සහ සීයා වහාම මා ලගට අවුත් බවලත් දෙදෙනා නැගිටුවා

ඈතට යවා මා දෙපස වාඩි වුහ. මගේ මතකයේ හැටියට මට සිහිය නැති විය.

විවේක කාලයේදී විකිණීමට ගෙනෙන ලද ටොෆි චොකලට් සහ ඔරේන්ජ් බාර්ලි දිගට හරහට මගේ නෑයන්ගේ අත්වලට ගියේය. ඒ සඳනා ගෙවීමට තරම් ප්‍රමාණවත් මුදලක් මා සතුව නොතිබු නිසා ශාලාවෙන එළියට ආ මම නයිලෝන් කමිසය ටෙෆි කාරයාට පුජා කර සියල්ල අමතක කිරීමට බාර් එක ලගට ගියෙමි. කෙල්ලගේ පියා සහ සීයා එතනට පැමිණ. "මහත්තයෝ අපිත් කන බොන මිනිස්සු!" යැයි කියා බියර් ඔඩර් කර බොන්නට වුහ. එම බිලද ගෙවා දැමු මම විවේක කාලය අවසන චිත්‍රපට ශාලාව යලිත් ඇඳිරි වී ගිය පසු හොරෙන්ම එළියට පැන පස්ස නොබලා ගෙදර දුව ආවෙමි.

**නිමි.**

Visit http://www.sinhalamp3.com - for more sinhala e stories

## කුස්සියේ මී සම්මේලනය

# නරලොව හොල්මන්

Copyright © by

චන්ද්‍ර අනගිරත්න

1965 - 1967



IGCAS www.sinhalamp3.com e Story Book's

මිහිරි ගී නාදයක් ඇසී මම මහත් බියට පත්විමි.වේලාව මධ්‍යම රාත්‍රි 12.39 ට පමණ ඇතැයි මම පට්ට කළුවරේම අනුමාන කළෙමි. වහාම ඇදෙන් බිමට පැන්න මම කළුවරේම බිම අත ගා සරම සොයාගෙන ඇද ගත්තෙමි. ගී නාදය තවම ඇසේ. ගෙදර මා පමණී. ගුවන් විදුලි යන්ත්‍රයද නිවා දමා තිබුණි. මිහිරි ගී නාදයේ කරච්චලය ඇසෙන්නේ කුස්සිය දෙසින්ය. මම පිල දිගේම ගොස් ජනේලය තුලින් කුස්සිය ඇතුලට හොස්ස දික් කෙලෙමි.
ආ - මා දුටු දර්ශනය!

කුස්සියේ පිගන් මේසය මත විශාල රැස්වීමකි. ලවුඩ්ස්පීකර් දෙකක් දුම් මැස්සේ දෙපැත්තේ සවි කර තිබුණි. පරණ පොල් කොළ සහ කොලපත් පට්ටා වලින් මුළු කුස්සියම සරසා වී පොතු ඉසීමෙන් ගොම පොළව පිරිසිදු කර තිබුණේය. මේසය මත ඇති මැටි කලගෙඩි දෙක මත පොල්මල් දෙකකි. දර මැස්ස උඩ ලී කෙලියක්ද. දුම් මැස්ස මත තිබු වළං අතර පෙලපාලියක්ද, කහ මිරිස් ගල මත ගොඩ නගන ලද වේදිකාවක විවිධ ප්‍රසංගයක්ද, කොරහ ඇතුලේ මාරක ලිදේ බයිසිකල් පැදීමේ දර්ශනයක්ද, නෑබිලිය අනිත් පැත්තට හරවා එය තුල වට සිනමා දර්ශනයක්ද විය. විමතියට පත් මම කට ඇරගෙන මහත් ඕනෑකමින් බලා සිටියෙමි. මෙය මීයන්ගේ රැස්වීමකි, මීයන්ගේ උත්සවයකි, මීයන්ගේ දිනයකි. මුළු කුස්සීයම මීයන්ගෙන් අතුරු සිදුරු නැතුව පිරී තිබුණි.

මේසය මත ගොඩ නගා තිබුණු වේදිකාවේ මුල් අසුනේ තඩි මීයෙක් වාඩි වී සිටියේය. "එක්සත් මී රැලිය" යන්න ලියන ලද පරණ රට බොඩියක් පටි දෙකෙන් දෙපැත්තට අල්ලා පොල් කටු හැදි දෙකකට ගැට ගසා ඒ ලගම සවිකර තිබුණි. "හොර පුසා හංග වේවා" , "වල් බාවා බිම බාවා" - "ජයගන්නට අපි ආවා" , "බළල් මොටා අපිට එපා" සහ "බලල් මොලේ - මෙදා ඇලේ" යනුවේන් සටන් පාඨ කියමින් දුම්මැස්සේ සිට පෙලපාලියෙන් ආ සමස්ථ ලංකා එක්සත් මීයන්ගේ වෘතීය සමිතියේ සහෝදර වරු වේදිකාව වටා සිට ගත්හ. ගී නාදය අවසන් විය. අත් පොලසන් මාධ්‍යයේ නැගිට ගත් මහා තඩි මියා, ඉදිරියේන් වු තේ පෙරණය කටට ලං කර, එයට ඇගිල්ලෙම් තට්ටු කර බලා. කතා කිරීමට පටන් ගත්තේය. කොස් ඇට මීයන් දෙදෙනෙකු විසින් එතුමාගේ වලිගය උස්සාගෙන සිටින ලදි.

"සහෝදර වරුනි , අපේ පරම හතුරා වන ප්‍රතිගාමී බළල් මොටාගේ කරේ බෙල් එකක් බදින්න තීරණයක් ගත් හැටිත්, එම තීරණය ක්‍රියාත්මක කිරීමට අපිට නොහැකි වුණ හැටිත් තමුන්නාන්සේලා හොදින් දන්නවා ඇති. එදා රැස්වීම කඩාකප්පල් වුනාට පස්සේ ඔය අදීධිරාජ්‍යවාදී, ප්‍රතිගාමී, දේශද්‍රෝහී, ජාති භ්‍රෂ්ඨ, ප්‍රතිගාමී කදවුරට අයත් ඔය බළල් මොටාට විරුද්ධව

නැගී සිටිමට අපිට අද අවස්ථාවක් ලැබුණා. අපි අද භයවෙන්න ඔනේ නැහැ - මේ ගෙදර අද කව්රුවත් නැහැ , එක හොල්මන් කාරයෙල් නම් ඉන්නවා - ඌ මෙලහකට ගොරව ගොරවා නිදි ඇති. ඒ නිසා, මේ පරම හතුරා වන බළලාගෙන් අප රට බේරා ගෙන අපේ සංස්කෘතිය , සභ්‍යත්වය, ශිෂ්ඨාචාරය, උන්නතිය, පෞද්ගලික නිදහස, පත්තර කෑමේ නිදහස, පොත් විකිණීමේ නිදහස, අල , ලූණු, උම්බලකඩ අදී පාරිභෝගික ද්‍රව්‍ය පාලනය මිලට හොරා ගැනීමේ නිදහස ආදිය රැකගැනීමට වහාම තීරණයක් ගනිමු. කතා කර කර ඉන්නට වේලාවක් නැහැ. ඔන්න සභාවට මං ඉඩ දුන්නා. ගෙනෙන යෝජනාවක් දැන්ම ගේන්ට. මම ඉද ගන්නවා."

මේ අනුව පහත සදහන් පරිදි එක එක යෝජනාවන් ඉදිරිපත් කරන ලද නමුත්, සභාපති මී තඩි තුමා ඒවා සියල්ලටම විරුද්ධ වුහ. සියලුම මීයන්ගේ කට හඩ එක සමාන වූ බැවින් මට ඔවුන්ගේ ප්‍රශ්න හා උත්තර ඇසුනේ මෙසේය.

"බළලාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කරමු - බැහැ, ඌ අපේ වැරදි පෙන්නලා ඇග බේරා ගනියි."

"බළලා ජනසතු කරමු - බැහැ එතකොට උගෙ නෑදෑයින්ට තැන හම්බුවේයි."

"ඌට කසාදයක් බැදල දෙමු. - බැහැ එතකොට බෝවීම වැඩි වේයි."

"ඌ පාර්ලිමේන්තුවට යවමු - බැහැ එතකොට ඌ අපිට අවාසි වේන හැටියට ව්‍යවස්ථාව සම්මත කර ගනී."

"බළලා කියන නම වේනස් කරල, ඌට වේන සිංහල නමක් දෙමු - බැහැ එතකොට ඌ ජාති වාදියෙක් වේලා අපිට උන් හිටි තැන් නැති කරයි."

" එහෙනම් අපි යවමු ඌව විශ්ව විද්‍යාලයට - එතකොට රටේ නැති වල්කම් ඉගෙන ගෙන ආවාම අපෙ ගන්න දෙයක් නැති වේයි."

"එහෙනම් ඌ එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනයට යවමු - අපෝ එතකොට ඌ මාලදිවයිනේ නියෝජිතයා එක්ක හැප්පුනොත් අපට උම්බලකඩ කෑල්ලක්වත් එවන්නේ නැති වේයි."

"බළලා මහන කරමු - එපා දිව්‍යලෝක - මනුෂ්‍යලෝක සැප සම්පත් ලැබීමටනම් මියන් දන් දිය යුතු යැයි කියල බණ දෙසයි, අනුමානයක් නැතිව."

"එහෙනම් උගේ හැටියට පබයෙක් හදල ගිනි තියමු - එපා ඌ

තවත් ජනප්‍රිය වෙයි."

"ඌට වෘත්තීය අයිතිවාසිකම් දෙමු. එපා එතකොට දේශපාලන නායකයො ලවා කොස් ඇට බාවා ගනී."

"එහෙම නැත්නම් - ඌට විරුද්ධව කැලෑපත්තර ගහමු."

"එහෙම කරොත් අනුමානයක් නැහැ  අහුවෙන්නේ මේ ගෙදර අර නිදාගෙන ඉන්න හොල්මන් කාරයා - පව්."

"එහෙනම් ඌට කුනුහරුපෙන් බැනල ලියුමක් දාමු. - ඒත් අහුවෙන්නේ මිනිහම තමා."

"එහෙනම් බළලුව ගුවන් විදුලියට යවමු. පව් ශාස්ත්‍රීය සංගීතකාරයින්ට තැන නැති වේයි."

"බළලා පොලීසියට අල්ලල දෙමු. - රාලහාමි අතේ ශත පනහක් තිබ්බම පොලිස් ජීප් එකෙන්ම ඌ සුවසේ ගෙදර -"

"බළලට විරුද්ධව හබයාස් කෝපුස් ආඥාවක් ඉල්ලල නඩුවක් දාමු. - මොන පිස්සුද - ඌ පස්ස දොරෙන්ම ඇවිල්ල අපෙ පෙරකදොරුවට වඩේ එකකුයි , ප්ලෙන් ටී එකකුයි අරන් දුන්නම ඒ යකා උගෙ පැත්තට කතා කරයි."

"ඒහෙනම් බළලුව ආදායම් දෙපාර්තු මේන්තුවට අල්ලල දෙමු. - පිස්සු - ලොකු නිලධාරියෙක් අල්ලගෙන තඹ දොයිතුවක් නැහැ කියලා ඌ තක්සේරු කරවා ගනීයි."

මෙකී, නොකී අන්දමට නොයෙකුත් යොජනා ඉදිරිපත් කරන ලදු නමුත් එකම යොජනාවකට හෝ මහ තඩි මීයා එකගනොවු හෙයින්, ජනේලයෙන් පිට බලා හිටි මටද කම්මැලි හිතිනී. මුන්ගේ කයිවාරුවේ තරමටම කෙරුවාවත් ඇත්දැයි විමසීමට සිතු මම "කදාචි" යැයි හඩ නැගිමි. ආශ්වයයීයෙකි! එකම මීයෙකුවත් එය ගණනකට ගත්තේ නැත. විමතියට පත් මම කුස්සියේ දොර ඇර ඇතුලට අඩියක් තබා "කදාචි" යැයි කීවෙමි.

මගෙ බුදු අම්මේ! මුලු මී රැලම මා වෙත කඩා පැන මා බිම දමාගෙන, මගේ අගේ අතුරක් සිදුරක් නෑර වසාගෙන "තෝ තමා හොර බළලා - අද තෝ ඉවරයි" කියමින් මට තර්ජනය කරන්නට වුහ.

"අයියෝ මියෙනි ,පෙම්බර මීයෙනි, සත්ගුණවත් මීයෙනි, සහෝදර මීයෙනි, මම නොවේ බළලා - මම මනුෂ්‍යයෙක්මි,"   යයි මා කොතෙක් පින්සෙන්ඩු වූ නමුත්, සියලුම මීයෝ "බළලා තොපම වේය!" යි වදාල සේක.

නායක මීයා මා අමතා , " හොඳයි, උඹ මනුෂ්‍යයෙක් නම් වහාම මේ ගෙදර ඉන්න නියම හොර බළලා අල්ලාගෙන ගඟට ගිහින් දාපන්! " යයි කියා, මා ඇඳ උන් සරම ඇප පිට තබාගෙන මා නිදහස් කලේය. කළුවරේම දිව ගොස් ඇඳ යටට රිංගා එහි සුවසේ නිදා උන් බළල් තඩියා ඔසවා වත්ත පහළට ගොස් මහවැලි ගඟට අතහැර ආපසු ආ මම යළිත් සරම නිදහස් කරගෙන සුවසේ නිදන්නට විමි. දැන් අපේ කුස්සියේ මීයෝ නිරුපද්‍රිතව සිටිති.

**නිමි.**

Visit http://www.sinhalamp3.com - for more sinhala e stories

## ලංකාව න්‍යස්ටික බෝම්බයක් පුපුරවයි

# නරලොව හොල්මන්

**Copyright © by**

**චන්ද්‍ර අනගිරත්න**

**1965 - 1967**



**IGCAS** www.sinhalamp3.com ⓔ Story Book's

මට විශාල බඩගින්නක් දැනුනි. ගෙදරින් පිට යතත් කුස්සියේ දොර නිකම්ම වසා දමා යෑම අම්මාගේ සාමාන්‍ය පුරුද්දක් වුවද, එදා අම්මා නාන්න ගගට යෑමේදී දොර යතුරු ලා තද කර ගියේ මා ගෙදර සිටි හෙයිනි. ලේබන කලාවට මෙන්ම කුස්සියේ සීනි බෝතලයටත්, උම්බලකඩ ටින් එකටත්, එෑණු මුට්ටියත්, පොල් බෑයටත් කුඩා කල සිටම එකාකාර ලැදියාවක් දැක්වීමට මා පුරුදුව සිටින බව අම්මාට රහසක් නොවේ. එමෙන්ම සීනි, උම්බලකඩ, එෑනු සහ පොල් වැනි කලාත්මක ආහාර ද්‍රව්‍ය මට සොයා ගත නොහැකි තැන්වල සඟවා තැබීමේ පුරුද්දක් අම්මාට ඇති බවද මට රහසක් නොවේ. කෙසේ වුවද, සොයන්නාට හම්බ වේ යන මතය අනුව ධෛර්යය උපදවා තමාට හොරෙන් කුස්සියේ හැළි-වලං අතගෑමට මා තුල ඇති සහජ දක්ෂතාවය ගැන අම්මා ප්‍රීතිය පළ කරන්නේ සාමාන්‍යයෙන් තමාගේ කටත් පොල්කටු හැන්දත් ක්‍රියාත්මක කිරීමෙන්ය. එහෙත් මම කිසි විටෙකත් පසුබට නොවෙමි. අදත් පසුබට නොවෙමි. බඩගින්න ඉතාමත් දරුනු ලෙස දැනේ. මම කුස්සියට රිංගමි.

කෙහෙල්මල් අහාර ද්‍රව්‍ය හිගයක් නිසා කුස්සියේද කිසිවක් නැත. සීනි වලින් බඩ පුරවා ගත නොහැකි බැවින්, සීනි බෝතලය නොසොයා මම දොර මුල්ල පරික්ෂා කළෙමි. ඊයේ හවස ඉවර කරන ලද වරකා ගෙඩියේ ඇට ටික දොර මුල්ලෙහි විය. මෙය හොඳට පිටි තිබෙන වරකා ගෙඩියක ඇට හෙයින්, මම කොස් ඇට කිහිපයක් ලිපට දැම්මෙමි. ලිපේ ගින්දර ටිකක් මදි වු බැවින් ළිපට මුහුන ළංකර පිම්බ කල විසිරී ගිය අළු නිසා මගේ මුහුන සිනමා නිලියකගේ මෙන් අලංකාර වු අතර, දිවට දැනුනේ අඹුල් රසයකි. මම සරමෙන් මුහුණ පිසදා ගත්තෙමි. යලිත් හොස්ස දික්කර මට පිබින්නට ලැබුණේ එක පාරකි. "ඩෝං" යන මහා හඬක් නංවා කොස් ඇටය පිපුරුවේය! මුළු ලෝකයම අන්දකාර විය!

හිරෝෂිමාවට පරමාණු බෝම්බය වැටුනු පසු මෙන් ලිපෙන් දස අතට විසි වී ගිය කොස් ඇට කෑලි සහ පිටිවලින් මගේ නහයත් කටත් පිරිනි. කොස් පොතු කෑල්ලක් උගුරේ හිර වී මට කැස්සක් ඇති විය. ඇස් දෙක අළු පිරීම නිසා නොපෙනී ගියේය. කොස් ඇටය පිපුරුනු හඬ නිසා කන් දෙක ඇතුලේ "ක්‍රිං" යන හඬක් ඇති විය. ගිනි පුපුරක් හිසකෙස් අතරට විසි වී තිබුන නිසා හිස දනන්නට විය. එක ගිනි පුපුරක කමිස සාක්කුව තුලට වැටී පපුව දනන්නට විය. තව ගිනි පුපුරකින් බඩ දනන්නට වු පසු මම සරම ගසා දැම්මේමි. මේ අතර

ගිනි පුපුරකින් බෙල්ල දන්නට වු නිසා මම විගහට බෙල්ල පිස දැම්මෙමි; පසුව බිම අතගා සරම සොයා ගෙන ඇඳ ගත්තෙමි.

කොස් ඇටය පිපිරීමේ ශබ්දය අසී අම්මා ගගේ සිට දිය රෙද්ද පිටින්ම දුව ගෙන අවුත්, වහාම මා කුස්සියෙන් එලියට ඇද, ප්‍රථමාධාර වශයෙන් පිට කොන්දට වේගයෙන් පහරවල් දෙකක්ද, හෙම්හින් පහරක්ද ගැසූ පසු, මගේ කටේ හිර වී තිබුනු කොස් ඇට කෑලි සහ පොතු බායියෙකු දුටු ණයකාරයෙකු මෙන් පළා ගියේ මගේ උගුරටත් නොකියාය. මේ අතර, වට පිටාවේ උන් සියලුම බවලත් උදව්ය, "මොකද අනේ? මොකද අනේ?" කියමින් අපේ කුස්සිය වටා රුස් වී අම්මාගෙන් කරුණු විමසන්නට වුහ. මා අතින් පිපිරුනේ කොස් ඇටයක්ය යන බව පැවසුව හොත් මගේ තත්වයට මදිකමක් වේ යැයි කල්පනා කල අම්මා ඔවුනට පැවසුවේ, "මොකක්දෝ සූත්තරයක් කරන්නට ගිහිල්ලා පුපුරලා!" යනුවේනි.

ටිකින් ටික තත්වය උගු අතට හැරුණී. ගමේ සියල්ලම ටිකින් ටික හා සමුහ වශයෙන් අපේ ගෙදරට ඇදෙන්නට වුහ. මා අතින් රතින්නයක් පත්තු වූ බව මෙයින් සමහරකට ආරංචි වී ඇති අතර, මා අතින් බෝම්බයක් පිපිරුන බවට සමහරකට සැල වී ඇත. කටින් කට ගිය කතා නිසා මේ සිද්ධිය පොලීසියට සැල වූයේ මා බෝම්බයක් හදමින් සිට එය පිපිරී ගිය බවයි. පොලීසිය වහාම

අපේ කුස්සියට අතුළට අවුත්, ලිපේ අළු සහ විසිරී ගිය කොස් ඇට කෑලි එකතු කොට රජයේ රස පරීක්ෂකයා වෙත යැව්වෝය. පොලීසියේ අදහස වූයේ යම් කඩාකප්පල්කාරී පිරිසකගේ උසිගැන්වීම පිට, මහා විප්පලවයකට අවශ්‍ය දරුණු ආයුධයක් තැනීමට මා පර්යේෂණයක යේදී සිටියදී එය පුපුරා ගිය බවයි. ඔවුන් අම්මාගෙන් කට උත්තර ලබා ගෙන, වැඩි දුර පරීක්ශණයකට ලක් කරන තෙක් ලිපට සීල් තබා කුස්සියේ දොර ලග මුර කිරීමට පොලිස් බටයන් දෙදෙනෙකු තබා ගිය පසු මම කට උත්තර නැතිව. බකං නිලාගෙන බඩ උලාගෙන සිටියෙමි.

සිද්ධිය මෙයින් කෙළවර වූයේ නැත. සවස් වීගෙන එන විට පුවත් පත් වාර්ථා කරුවන් අපේ ගෙදරට අවුත් මේ ගැන අම්මාගෙන් සහ මගෙන් ප්‍රශ්න කර, සිද්ධිය වාහාම ඒ ඒ පුවත් පත්වලට වාරථා කල අතර. එතෙක් කෝපයෙන් මා දෙස කෝපයෙන් රවාගෙන සිටි අම්මාට හිනාවේන්නට කියා ජායාරූප ගැනීමටද අමතක කලේ නැත. ඔවුන් ගිය පසු අම්මා මට දෙහි කපන්නට වූවාය. එහෙත් පසුදා පුවත්පත් වල පළ වූයේ මගේ විද්‍යාත්මක පර්යේෂණයන් සඳහා මට නොමසුරු ආධාරය සහ අනුබලය දී ඇත්තේ අපේ අම්මා බවය.

පසු දින මා අත් අඩංගුවට ගන්නා ලදි. අපරාධ නඩු සංවිධාන සංග්‍රහයේ 114,115, සහ 279 යන ජේදයන් යටතේ මට විරුද්ධව නඩු පැවරීමට පොලීසිය කටයුතු කෙලේය. මේ අතර, දිවයින පුරා හදිසි නීතියද, මහනුවර දිස්ත්‍රික්කය පුරා ඇදිරි නීතියද පනවන ලදි.

විදේශ රටවල මේ පුවතට විශේෂ තැනක් ලැබිනි "ලංකාව පරමාණු බෝම්බයක් පුපුරුවයි" , "ලංකාව න්‍යෂ්ටික අයුධ තනයි", "ලෝක සාමයට ලංකාවේන් තර්ජනයක්" , ලංකාවේන ජලකර බෝම්බයක්" සහ න්‍යෂ්ටික බලය ලංකාවටද?" ආදී ශීර්ෂයන්ගෙන් යුතුව විදේශීය පුවත් පත් වල විස්තර පළවන්නට විය. මේ අතර, පොළව යට හා අළු යට කෙරෙන න්‍යෂ්ටික අත්හදා බැලීම් වහාම නවත්වන ලෙස ලෝකයේ සෑම රටකින්ම පාහේ ලංකාවට කේබල් පණිවුඩ ගලා ඒන්නට විය. තවද, අර්ධ න්‍යෂ්ටික අවි තහනමට මෝස්කව් නුවරදී අත්සන් තැබු ලංකාව එකී ගිවිසුම කඩ කිරීමේන්  මහා වරදක් කර ඇති බැවින් එක්සත් ජාතීන්ගේ අරක්ෂක මණ්ඩලය වහා රැස් කරන මෙන් ලෝකයේ මට විරුද්ධ සෑම රටකින්ම බල කිරීමක් විය. ජිනීවා නුවර පැවැත් වෙන න්‍යෂ්ටික අවි පිලිබඳ කතා බහට මගෙන් ලැබී ඇත්තේ මරු පහරක් බව බොහෝ රටවල් ප්‍රකාශ කර සිටියහ.

කෙසේ වුවද, අපේ අම්මාගේ ඉල්ලීම අනුව එක්සත් ජාතීන්ගේ විශේෂ නිරීක්ෂක පිරිසක් අපේ ගෙදරට අවුත් මෙ සිද්ධිය පිලිබඳ පරීක්ෂණ පවත්වන බව, රිමාන්ඩ් බාරයේ සිටි මගේ දැන ගැනීමට ලක් කෙරිණි. කුමකින් කුමක් සිදුවන්නට යන්නේ දැයි නොදැන, එඩරු තෙල් පානය කර ශරීර සෞඛ්‍යයේ විපර්යාශයකට පත් වූවකු මෙන්, බයෙන් ගැහි ගැහී රිමාන්ඩ් බාරයේ සිටි මම, මෙම විශේෂඥ පිරිසට සත්‍යය අවබෝධ කරවන මෙන් දෙවියන් වහන්සේට යාච්ඤා පැවැත්විමි.

ලෝක විශේෂඥයන් අපේ කුස්සියේ පර්යේෂණ පවත්ව ගමන්, දොර මුල්ලේ තිබුනු කොස් ඇට දැක අම්මාගෙන් විශේෂයෙන් ඒ ගැන ප්‍රශ්න කර ඇත. එම කොස් ඇට තම්බාගෙන හෝ, කබලෙන් බැද හෝ ලිපේ දමා පුලුස්සා හෝ කෑමට ගත හැකි බවත්, එය ඉතා රසවත් කෑමක් බවත්  අම්මා ඔවුනට පවසා තිබේ. හදිස්සි වු ඉවුන් එය ඉතා ඉක්මණින් පිලියෙල කර ගත හැක්කේ කෙසේ දැයි ප්‍රශ්න කල පසු අම්මා කියා ඇත්තේ, ලිපට දමා පිලිස්සීමෙන් කාර්‍යය ඉක්මන් කල හැකි බවයි. ඔවුන් කොස් ඇට කිහිපයක් ලිපට දමා ළගට වී බලා සිටි අතර, අම්මා ලිපෙන් ඈත් වී සිටියේ කොස් ඇට වල පිටි වැඩි බව දත් නිසාය. මොහොතකින් කොස් ඇටයක් පිපිරී ගොස් ඇති අතර, එයින් බියට පත්ව උඩ ගිය විශේෂඥයින්ගේ ඔළුගෙඩි වැදීම නිසා දුම්මැස්ස කැඩී, පෙරලී ගිය හැලි වලං වලින් කිහිපයක් ඔවුන්ගේ හිස් වසා හිරි වී ඇත.

විශේෂඥයන් ආධාර ඉල්ලා කෑ ගසද්දී, අම්මා ඔවුන්ගේ ඔළු වල හිරවුණු හැලි වලං ඉවත් කර ඔවුන් බේරා, මා අතින් වුයේද එවැනිම සිද්ධියක් බව ඔවුන්ට පෙන්නුම් කර සිටියාය. සත්‍යය අවබෝධ කර ගත් ඔවුහු කොස් ඇට සමාන්‍ය වශයෙන් අන්තරාදායක වුවද ලෝක සාමයට තර්ජනයක් එයින් නැති බවත්, මගේ අතින් කිසිදු වරදක් සිදු වී නැති බවත් ලංකා ආණ්ඩුවට සහ ලෝක සමුළුවට අපේ කුස්සියේ සිටම ගුවන් විදුලි පණිවුඩ මගින් දන්වා සිටියහ. එමෙන්ම, මා වහාම රිමාන්ඩ බාරයෙන නිදහස් කල යුතු බවත්, මගේ ආරක්ෂාව සඳහා අපේ වත්තේ වරකා ගහ කපා දැමිය යුතු බවත් ඔවුහු වැඩි දුරටත් නිර්දේශ කලහ.

මා රිමාන්ඩ් බාරයෙන් මිදී ගෙදර එන විට ලෝකය සන්සුන් වී තිබු අතර, ලංකාව ලෝකයේ බලගතු රටක් විදියට මුළු ලෝකය විසින්ම පිලිගනු ලැබී තිබුණි. එහෙත් රටත් වඩා වැදගත් යමක් සිදු වී ඇති බව පෙන්වීමට අම්මා මා වත්තට කැඳවාගෙන ගියාය. බලපත්‍ර ලබා ගත නොහැකිව මෙතෙක් කල් කැපීමට ක්‍රමයක් නැතිව තිබු කොස් ගස වත්ත මැද කපා දමා තිබු අතර, ලී ඉරීම සඳහා සාදන ලද අට්ටාලයක් මත සිංහ කොඩිය බැබලෙමින් තිබුණි.

**නිමි.**

Visit http://www.sinhalamp3.com - for more sinhala e stories

ලිද ලග කල වැඩක්

# නරලොව හොල්මන්

Copyright © by

චන්ද්‍ර අනගිරත්න
1965 - 1967



IGCAS www.sinhalamp3.com e Story Book's

බවලත් උදවිය නාන අවස්ථාවක් ම බලා, නා ගැනීම සඳහා ලිඳට යාමට මා පුරුදුව ඇත්තේ, ස්වභාවධර්මය දෙස එබිකම් කිරීමට මා තුල ඇති කලා රුචිය නිසාම හෝ සත්‍යය ඒ සැටියෙන්ම දැකීමට හුරු වූ මාගේ දාර්ශනිකත්වය නිසාම හෝ නොවේ. වැඩියෙන්ම ඔවුනගේ කතාබහට කන්දීමෙන් ලද ඉමහත් ආස්වාදය නිසාය.

රටේ අමාරු තත්වය පිරිමින්ට වඩා හොඳින් වටහා ගැනීමෙන් දෝ ඔනෑවටත් වඩා ඉහලින් දිය රෙද්ද තද කර ගන්නා මොවුන් කිචිබිචියත් සමග අංග චලනයට මුල් තැන දෙවා කතා කරනා කතා බහ එතර වැදගත් නොවේ. එහෙත් අද ඔවුන්, කෞතුකාගාරයට යැවීම පිනිස ලොරියක් එන තෙක් රැස් කර තබා ඇති ගල් රූප මෙන් ලංවී නොසැලී උනන්දුවෙන් කරන කතා බහ නම් වැදගත් විය යුතු බව ඈත දීම මට වැටහුණි. මම පදුරු අස්සේ පහත් වී හෙමින් හෙමින් ළිඳ ලගට ඇදී සැගවී සිට කන දුන්නෙමි. හත් දෙනෙකුගෙන් සමන්විත වූ බවලත් පිරිසේ කතා බහ මෙසේ විය.

"බලන්න අනේ රටේ හැම බඩුවක්ම ගණං යනව."

"ඒක නේන්නං අනේ, එකට දෙක තුන හතර ගණං ගිහිල්ල."

"බඩු කියන දේවල් වලිං තවම ගණං ගිහිල්ලා නැත්තේ අනේ අපි විතරයි!"

"උංගේ ගණංවලට අපි අහුවෙනව අනේ!"

"අපි උං ගණං ගනනවා වැඩියි අනේ!"

"මං කියන්නං, අනේ!"

"වට් අනේ?"

"මං කියන එක ඔයාල කරනව ද?"

"ටෙල් කො අනේ!"

"අපි ගණං උස්සමු!"

"ඔව් අනේ - අපි ගණං උස්සමු!"

"පිරිමි තුට්ටුවකටවත් ගණං නොගෙන, උංගෙ දිහා බලන්නෙවත් නැතුව, උං කියන දේ අහන්නෙවත් නැතුව, උං දෙන දේවල් ගන්නෙවත් නැතුව අපි ගණං පිට ඉමු. එතකොට අනේ උං අපෙ ගාවට දණ ගාගෙන, බඩ ගාගෙන, හතරට නැමී නැමී, වැඳ වැඳ එයි!"

"ගුඩ් අනේ!"

"දැන් අනේ, අරය නාන්න එන වෙලාව! වෙනද වගේ එයා අපේ දිහා හොරෙං බලන්නයි, හිනාවෙන්නයි, කතා කරන්නයි, අපේ ලවා පිට අතුල්ල ගන්නයි, සරම හෝද ගන්නයි දඟලයි අහුවෙන්න එපා!"

"චී අනේ - අපි එහෙම අහුවෙන්නෙ නෑ."

"එයා ගෑනුනට හරිම ආසයි. මං හිතන්නේ ලෝකෙන් එයාට හොඳම, වටිනාම, ලස්සන දේවල් තමා අපි! එයාට අපිත් එක්ක නෑවත් සැපයි! එක නේ අපි ඉන්න වේලාවටම එයා නාන්න එන්නේ!."

"මෙලාට අනේ එයා ඇවිල්ලා හැංගිල ඉන්නව ද දන්නෙත් නෑ!"

"ඔයාට පිස්සු! එයා ඈත ඉදනම ඔලුව උස්සගෙනයි එන්නේ - අපි ඉන්නවද කියලා බලාගෙන - තව කොහෙද!"

"වංගුවෙන් එනකොට පේනව! එතකොට අපි ලෑස්තිවෙමු. මං නං නාලත් ඉවරයි!"

"මාත් එහෙම තමා. ඒ වුනාට එයා එනකංම නාමු."

හඹුහොරුව යට සිට සේනකාදී පණ්ඩිතයන් සිවු දෙනාගේ රහස් අසා ගත් මහෞෂධයන් මෙන් වැටකෙයියා පඳුරු අස්සේ සිට සියල්ලට කන් දුන් මම, නැමී සිටි අයුරින්ම පස්සෙන් පස්සට ගොස්, වංගුව පසුකර නැගිට ගෙන, කිසිත් නොදත්තකු සේ යළිත් ළිඳ දෙසට පා නැගුවෙමි. කාන්තාවෝ මහෞෂධ පණ්ඩිතයෝ දැන් එති දැන් එති යි කොක් කරක් සේ දික්වූ කර ඇතිව උන් කේවට්ටයන් මෙන් මග බලා සිටියෝ මා දුටු සැනින් අනික් පැත්තට හැරී වතුර අදින්නටත්, සබන් ගාන්නටත්, කුණු අතුල්ලන්නටත් වූහ.

මම ලිඳට ළංවීමි, ඇඳුම් මාරු කළෙමි. ඔවුන් සිටින බවක් වත් නොදුටු ලෙස, වැටකේ පඳුරු දෙසට පියාසරකරමින් උන් සමනලයන් දෙස නෙත් හෙලා, "ආ කොච්චර ලස්සන සමනලයො ද! මනුස්සයොත් මෙහෙම ලස්සනට ඉන්නවනං කෝච්චර හොඳ ද!"කියා, වල් කපමින් උන් පොඩි කොල්ලකු හා කතාවට වැටුණෙමි. කාන්තාවෝ කෙස් රොදවල් මෑත් කර මුහුණු පෙනෙන්නට සැලැස්වූහ.

"ආං බලනව අයිසේ අර දේදුන්නේ ලස්සන!" මම අහසට ඇඟිල්ල දික් කෙලෙමි. "ඔය වාගේ පාට අපිට තියෙනව නං!"

කාන්තාවෝ වඩාත් උස් ගල් උඩ කකුල් තබා, වඩාත් නිදහස්ව කකුල්වල කුණු අතුල්ලන්නට වූහ.

"අයිසේ බලනව අර කඳු ගැට වල ලස්සන!" මම ඈතට අත දික් කලෙමි.

කාන්තාවෝ දිය රෙදි වඩාත් බුරුල් කරගෙන ඔවුනොවුන්ගේ පිට අතුල්ලන්නට වූහ. එහෙත් මේ පුතා නොවේ ඒ දෙස හැරී වත් බැලුවේ!.

"මහත්තයට මේ මල කඩල දෙන්න ද?" කොල්ලා ඇසුවේය.

"ඔව් අයිසේ, වැටකෙයියා මල් වලට මම හරි ආසයි. බලනවකො සුවඳ විතරක්! ආ අපෙ ඇඟවලත් මෙහෙම සුවඳ තියෙනව නං!" මම වැටකේ මලක් ගෙන ඉඹින්නට වුයෙමි.

වැඩි වැඩියෙන් සබන් ගා ගත් කාන්තාවෝ වේනත් වුවමනාවක යෙදෙන්නාක් මෙන් මා ළඟින්ම එහෙ මෙහෙ යන්නට වූහ.

"අයිසෙ ඔය මොන කුරුල්ලන්ගෙ සද්දෙ ද?"

"මහත්තයා ඒ බට්ටිච්චො!"

"ඇත්තටම හරිම ලස්සන කට හඩක් නේද උන්ට තියෙන්නේ! හරියට සංගීත භාණ්ඩෙක හඩක් වගේ නේ - මිනිස්සුන්ටත් ඔය වගේ ලස්සනට -

කාන්තාවෝ ඔවුනොවුනට කිති කවා ගනිමින් කිචිබිචි ගා සිනා හඩ නංනා. මවාගත් සුරතල් හඩින් කතාබස කරන්නට වූහ. එහෙත් එය අසුනු බවක් වත් දැක්වූයේ මේ පුතා නෙවේ!.

ඇයි මහත්තයා නා ගන්නේ නැද්ද ? කොල්ලා ඇසුවේ මා ඇදුම් අතට ගනු දැකය.

"නෑ අයිසේ, මෙතැන හරි නෑ - ඉඩක් නෑ මං යනවා කුඹුකේ ළිදට. මීට පස්සේ මගේ සිතේ මෙහාට නෑවිත් එහාට යන්නයි" කියා මම හැරුණෙමි.

"අපි නාලා ඉවරයි! දැන් නාගන්න!" එකියක් කීවාය.

"ඒ උනාට ළිද ලග තවම ඉඩ නෑනේ!" මම බොරු කනස්සලු ගතියක් පෙනවීමි.

"අපි දැං යනව!" තව සුන්දරියක් කීවාය.

"මෙතන කව්රුත් නැතිව තනියෙන් නාන්න බෑ!" මම යටි තොල පෙරලිමි.

"ඔච්චරම තනිය නං අපි ඉන්නං!"

"කව්රුත් නිකං බලං ඉන්නකොට මට නාන්න බෑ!"

"එහෙනං අපි තව නාන්නං! කොච්චර නාවත් ඇගට අල්ලලන එකක් යෑ!" කානතාවෝ යලි බාල්දි අතට ගත්හ.

"මගේ මේස් බැනියමක් හෝද ගන්නනත් තියෙනවා!"

"අප්පේ ඕකත් වැඩක්ද? මං හෝදල දෙන්නං! නෑනල මස්සිනාලගේ වැඩ කරල දුන්නම මොකෝ! ඒක් පිනවන්තියක් ඉදිරිපත් වූවාය.

"මගේ පිට අතුල්ල ගන්නත් ඔනේ - මෙතන ගහක් වත් නෑ."

"මොකෝ වේනදත් පිට උලා ගත්තේ ගහෙන්ද? ඔන්න ඔහොම නැවේන්න!" කියා තව සුන්දරියක් මට කිට්ටු වූවාය.

"රිදෙනව නං කියන්න!"

"කාටද - පොලීසියටද?"

"නෑ - නැන්දම්මට!"

"ඒ කියන්නෙ ඔයාල අම්මට ද?"

"හරි නරකයි!" කියා ඈ මගේ පිට කෙනිත්තුවාය.

"ඌයි ඔන්න මං වේන ලිදකට යනවා!"

"අනේ එපා"

ගණං ඉස්සීමෙන් විනාඩි දහයක් ගත වන්නට පෙර ඔවුනගේ ගණං බස්සවා, පෙර තුබුණාටත් වඩා පහළ බැස්සීමට සමත් වු මා කවදා හරි ලංකාවේ මුදල් ඇමති කමට සුදුසු නැද්ද කියා ටිකක් කල්පනා කර බලන්න!.....

නිමි.

Visit http://www.sinhalamp3.com - for more sinhala e stories

## මඟුල් ගෙදර පැවැත් වූ කතාව

# නරලොව හොල්මන්

Copyright © by
චන්ද්‍ර අනගිරත්න
1965 - 1967



IGCAS www.sinhalamp3.com e Story Book's

මා සාමාන්‍යයෙන් මගුල් උත්සව වලට සහාභාගි වීමට කැමැත්තක් නොදක්වන්නේ මගුල් ජෝඩුව දකින විට දරාගත නොහැකි ඉරිසියාවක් හිතේ හට ගන්නා නිසාම නොවේ - එක්කො මනාලියගේ හෝ මනාලයාගෙ පාර්ශවය වෙනුවෙන් කතාවක් පැවැත්වීමේ බර නිසැකයෙන්ම මගේ කර පිට පැටවෙන බැවිනි.

කරන ලද සංග්‍රහ වලට ස්තූතිය පුද කිරීමත්, ප්‍රමාද දෝෂයක් සිදුවුනි නම් සමාව ඉල්ලා සිටීමටත්, මනාලයාගේ හෝ මනාලියගේ හෝ ගුණ වර්ණනා කිරීමත්, ඔවුනගේ අනාගතය කිරියෙන් හා පැනියෙන් ඉතිරේවායි ප්‍රාර්ථනා කිරීමත් ආදී එකාකාර විදිහේ මංගල දේශනා පැවැත්වීම මට මහත් වාතයක් වී ඇත.

කෙසේ වුවද, ළඟදී මගේ මිත්‍රයකු ගේ මගුල් උත්සවයට සහාභාගී වූ මනාලියගේ නිවසේදී කතාවක් කළේ දිවා භෝජනයට පෙර කරන ලද මත් පැන් සංග්‍රහයෙන පදමට වූන් විය. වෙනදා මෙන් නොව මෙදා මට කියවුණේ ඇත්තය. ඒ කතාව මෙසේය.

" මංගල සභාවෙන් අවසරයි, හිතවත් බවක් පෙන්වන නෑදෑවරුනි, හිතවතුනි, මිත්‍රවරුනි, මව්වරුනි, පියවරුනි, සහෝදරියනි, මට පේන්න බැරි දෙයක් තමා මගුල් ගෙදරකට ආවාම කතාවක් පවත්වන්නට කියල මට කරදර කරන එක. කොහොම උනත් කතාවක් කිරීමට ලැබීම ගැන මම බොහෝම සන්තෝෂ වෙනව කියල කියන්නං - හිත යටින් ' නොදකින් මෙහෙම කරුමයක් ' කියල මටම කියා ගන්න ගමන්."

"මේ විවාහය කියන දෙය ජීවිතයේ බොහෝම භයානක අනතුරක් කියල කියන්න පුලුවං - හරියට මොටෝ සයිකල් ඇක්සිඩන්ට් එකක් වගේ. එක අතකින් ඇක්සිඩන්ට්, ඒකකිං ඇතිවන තුවාල හොඳකර ගන්න පුලුවන්. නමුත්, මං අවධාරණයෙන් ම කියන්න කැමතියි, මේ විවාහයෙන් ඇතිවන තුවාලය නම් කිසිදාක හොඳ වෙන්නේ නෑ. විවාහය කියන එක මහා වාතයක්!. කල්පනා කරලා බලන්න, තනියෙන් ජීවත් වේන්න තියෙනවනම් කොච්චර ජොලිද! ආශාව තියෙනකම් එකට ඉන්නවා. එපා කියලා හිතුනාම දාලා ගිහිං වේන ගෑනියෙක් එක්ක ඉන්නවා. ආන්න එහෙම තමන්ට කැමති පරිදි සැපෙන විනෝදයෙන් වගකීමෙන් තොරව මනුස්ස සැප විඳීමට තියෙන මූලික මානුෂික නිදහස - මේ කෙහෙම්මල් විවාහය කියන බැඳීම නිසා අපිට අහිමි වෙනවා. ගෑනි හොඳ උනත් නරක උනත් අපිට වෙන්නේ සදාකාලික හිරකාරයෝ වෙලා බැඳගත්ත බෙරේ ගහන එකයි."

"ඇත්තම කියන්න, පිරිමින් වශයෙන් අපේ කැමැත්තක් නෑ විවාහයෙන් හිර වෙලා අපේ නිදහස නැති කර ගන්න. නමුත් මේ ගෑනු - ඒ කියන්නෙ බවලත් උදවිය තමා කොහොම හරි අප

පටලවාගෙන අපිව සදාකාලික සින්න කරගන්න පොතේ කුරුටු ගාන්න දගලන්නේ. ඉතිං අපි උන්ට මැරෙනකං කන්න අරං දීපල්ලා, බොන්න අරන් දීපල්ලා, අඳින්න අරන් දීපල්ලා, අරක ඕන කියන කොටයි, මේක ඕන කියන කොටයි - ඕව ඉතිං කියලා වැඩක් නෑ අපිට වෙන ගෑනියෙක් දිහා බලන්නවත් දෙන්නේ නෑ. ඕන්න ඕකයි මේ කෙහෙම්මල් විවාහයෙන් ලැබෙන කජ්ජ!."

"කොහොම උනත් මේ විවාහ මංගල්‍ය උත්සවය බොහොම සාර්ථක එකක් කියල කියන්න කැමතියි. මනාල මහත්තයත් එක්ක එන ගමනේදී අතර මගදී කාර් එකේ ටයර් එකක් ගියා.තවත් තැනකදී පැට්රොල් හිරවුනා. ලගටම එනකොට ඇන්ජිම නතර උණා. අපි ඔක්කොම බැහැලැ දැම්මා නේද මාර තල්ලුවක්! මනමාල මහත්තයා තල්ලුව දාන කොට වටපිටාවේ කොල්ලො කුරුට්ටො දැම්මා නේද මාර හුවක්!. දත් කුට්ටම ටිකක් බුරුල් හින්දා මිසක්, අපේ මනමාල මහත්තයා උන්ට හොඳවායින් දෙකක් නොකියා ඉන්නේ නෑ."

"අපි මෙහෙට සම්ප්‍රාප්ත වෙනකොට පත්තු කරපු රතිඤ්ඤාවලින් බොහෝමයක් ම චුස් ගියා, රබාන පැලුනු හඩ අපිට කාර් එක ඇතුළේදීම අහුණා. ජයමංගල ගතා කියපු ගෑනු ලමයින්ගෙන් අර කොණේම හිටිය ලමයා නම් ටිකක් හැඩයි. අනික් අය හරිම ගොරක තමා. ගාථා කීවෙත් වරද්ද වරද්දා!."

"අපිට වාඩි වෙන්න දුන්න පුටුවල, මගෙ අම්මේ, එහෙම මකුනො ගොඩාක්! මං වාඩි වෙච්ච පුටුව කැඩිලා. මගෙ පස්ස පැත්ත තවම රිදෙනවා, පුටුව කඩාගෙන බිම වැටුන පාර.වෙඩින් කේක්වල ඇතුලේ තිබුනෙ මුද්දරප්පලං නෙවේ - රටඉඳි! කිරිබත් පිලුණුවේලා හොඳටම - මං හිතන්නේ මංගල්ලෙ ජයට ගන්න කලින් ඉදංම සුදානම් වේලා හිටිය හින්දා වෙන්න ඇති, කැවුම් හදලා තිබ්බේ සීනි දාලා - මෙහෙට කොහෙන්ද කිතුල් හකුරු."

"මේ සාර්ථක විවාහ මංගල්‍ය උත්සවේ ගැන මං වැඩිය කතා කරන්න කැමති නෑ - මොකද මට පේනවා මනමාල මහත්මිය කොච්චරවත් අත් ඔරලොසු දිහා බලනවා. ඒක හිටලද නැත්නං යන්න හදිස්සිද කියලා දෙයියෝ තමයි දන්නේ. කොහොම උනත්, සාමාන්‍ය සිරිත අනුව අපේ මනමාල මහත්තයා ගැන යමක් සඳහන් කරන එක මගෙ යුතු කමක්. මනමාල මහත්මිය ගැන යමක් කීමට මං දන්නේ නෑ. මං හිතනවා ඒක මගෙ වාසනාවක් මෙන්ම අප කාගේත් වාසනාවක් කියලා! කොහොම උනත් සඳහන් නොකරම බැරි දෙයක් තමා - සමාවෙන්න මනමාල මහත්මිය මගේ කකුල කිනිත්තුවා - ඌයි - රිදෙනවා! කමක් නෑ! එයා අකමැති හින්දා මං එයා ගැන මොකවත් කියන්නේ නෑ."

" අපෙ මනමාල මහත්තයා ගැන යමක් සඳහන් කරනවා නං- මං කියන්න කැමතියි - අද, මේ අවස්ථාවේ විතරක් නෙවේ එයාගෙ

මනමාලකං කවදත් එක වාගෙ තමා. මං පුංචි කාලේ ඉදන්ම මේ මනමාල මහත්තයා කිට්ටුවෙන්ම අශ්‍රය කරා - මොකද - එයාගෙ ගෙ තියෙන්නේ අපෙ ගෙ කිට්ටුවම. අපෙ තාත්තා මනමාල මහත්තයා ඉපදෙන්නත් ඉස්සර ඉදන්ම එයාගෙ මව සමග කිට්ටු ආශ්‍රයක් තිබුනා. අපෙ අම්මා කොච්චර ගොහොරි දැම්මත් අපේ තාත්තා නෙමේ ඒ සම්බන්ධෙ අත් හැරියේ. අපේ පවුල් දෙක අන්‍යොන්‍ය වශයෙන් එහෙම කිට්ටුවෙන් සම්බන්ධවෙලා තිබුන හන්දා මට මේ මනමාල මහත්තයා ගැන නිර්භයවම කතා කරන්න පුලුවන්.

සමහර ගුරුවරු මෙයාට කොච්චර ආදරේ කරාද කිව්වොත් එකම පන්තියේ අවුරුදු හතර පහ මෙයාව තියා ගත්තා. ඉස්කෝලෙං අස්වෙලා රක්ෂාවක් හම්බු වෙනකං මෙයා නිකං හිටියෙ නෑ. මෙයාගෙ තාත්තා ජේ. පි. පට්ටම ලැබුනායින් පස්සේ හරක් හොරකම නතර කළාම, මෙයා පියාගෙ රාජකාරිය බාරගෙන රටත් හොඳින් සේවය ඉටු කළා."

මේ මනමාල මහත්තයා දක්ෂතාවයන් කිහිපයක් තියෙන පුද්ගලයෙක්. "ලොවින් එකෙක් එක් දේකට වෙයි සමත කියන අලගියවන්න මුකවැටි කවියාගෙ කියමන. මේ මනමාල මහත්තයා හින්ද බොරු වෙනවා. එකකට එකක් වෙනස් රක්ෂාවල් සිය ගණනක් මෙයා කරලා තියෙනවා. එක රක්ෂාවක් මාසයකට වැඩිය මෙයා කරේ නෑ. රස්සාවල් දුන්න අය බංකොලොත් වුනත් මෙයා නෙවේ බංකොලොත් උණේ.

මෙයාට පොලීසිය ගෙදර වගේ. උසාවිය සෙල්ලම් පිට්ටනිය වගේ. හිර ගෙදර "ක්ලබ්" එක වගේ. ඉස්පිරිතාලය රෙස්ට් හවුස් එක වාගේ. මෙයාට කොතැනත් එකයි.මෙයා කොතැනත් ජනප්‍රියයි.

"මෙයාගෙ අත් අකුරු ලස්සනයි කියලා මගේ කනටම ඇහිලා තියෙනවා ගෑනු ලමයි සිය ගණනක් විතර කියනවා. නමුත් එකම ගෑනු ලමයකුටවත් මාසෙකට දෙකකට වඩා අහුවෙන්නෙ නැතුව බේරිලා සිංහල සංස්කෘතිය අනුව, වැඩිහිටියන්ගෙ, යෝජනාවක් අනුව මේ විවාහයට කැමති වීමට තරම් මෙයා කීකරු හැදිච්ච කමක් තියෙන කෙනෙක් වීම ගැන මනමාල මහත්මියගෙ පැත්තෙ අය අඩම්බර වෙන්න ඕනෙ."

"මේ මනමාල මහත්තයා තරම් යුතුකම් ඉටුකරන පුද්ගලයෙක් මං කවදාවත් දැකලා නැහැ. එක් කෙල්ලෙක් සමග සම්බන්ධකම් පවත්වද්දී අත්වැරුද්දකිං ඒ ගෑනු ලමයට බබෙක් ලැබුණා. මේ පොඩි ලැබුණා. මේ පොඩි බබෙක්! එච්චර ලොකු නැහෑ! පොඩි අත් වැරුද්දක් උනත් මේ මනමාල මහත්තයා නොසලකා හිටියේ නෑ - අද උනත් පඩියෙන් භාගයක්ම මෙයා ඒ ගෑනු ලමයටයි, අත් වැරුද්දෙන් ලැබුණ දරුවටයි වියදම වශයෙන් දෙනවා. ඒ

කොහොම උනත් මේ මනමාල මහත්මියට තියෙන කුළුදුල් ආදරේ - හින්දා මේ විවාහයට මේ මනමාල මහත්තයා. . . . . . . "

මගෙ කතාව නතර කල මනාමාල මහත්මියගේ පියා "පොඩ්ඩක් ඔහොම නතර කරන්න!" කියා කාමරයට ගියේය. මොහෙතකින් ඔහු කාමරයෙන් එලියට ආවේ තුවක්කුවක සහ පතරොම් කිහිපයක් අතැතිවය. " මනාලයත් ඒ එක්ක ආපු හැත්තෑ වරිගයත් දැන්මම මේ ගෙදරින් පිට උණේ නැත්තං එක එකා බාවනවා! මේ වගේ වනචරයෙකුට මගේ දුව කෑලි කෑලිවලට කෑපුවත් දෙන්නේ නෑ - හොඳ වේලාවට කසාදේ හවස රෙජිස්ටාර් කරන්න ලෑස්ති කර ගත්තේ! මැරුං නොකා පලයව්!" ඔහු ගර්ජනය කරන්නට විය.

නගුට අමුඩ ගසා ගත් අපි වහාම කාර් වලට පැන පිට වීමු. අතරමගදී කාර් නතර කළ මනමාලයාගෙ නෑදෑයෝ මා වැලඳගෙන ඉබින්නට වූහ.

" අර - වචනය දුන්න හින්දා මේ මගුල කරන්න ඉදිරිපත් වුණාට මොකද, පස්සේ උං ගැන ආරංචි වෙච්ච ඒවා ගැන හැටියට මං හරිම වේදනාවකිං හිටියේ මේ මගුල ගැන. මහත්තයාගේ කතාව නිසා අපි බේරුණා," යැයි පියා කීවේය.

"උං දෑවැද්ද දෙනවා කියලා කීවෙත් බොරුවට! අපි මේ ලමයා හිංදා බේරුනා!" මව කීවාය.

"අම්මලා තාත්තලා මොනවා හරි කර ගනියි කියලා බයේට මේ යොජනාවට මං කැමති වුණාට මචං, මේ මගුල උණානං මටයි දිවිනහගන්න වෙන්නේ! මචං උඹ මාව බේරුවා!" මගේ මිත්‍ර මනාලයා කීය.

"අෑ මහත්තයෝ , මහත්තයා කතාවේදී කිව්වා නේද අපෙ පුතා කවුදෝ ඒක්ක සම්බන්ධ වේලා ළමයකුත් ඉන්නවා කියලා - යමුද එහෙ බලන්න!" පියා යොජනා කළේය.

අපි එහෙ ගියෙමු. මිත්‍රයාගේ මවත් පියාත් නෑදෑයෝත් එහෙදී මහත් සතුටට පත් වුහ.

"සීදේවි ගෑනු ළමයා!" පියා කීය.

"ලස්සන දරු පැටියා!" මව කීවාය.

"හොඳ ගේ දොර!" නෑදෑයෝ කීවෝ ය.

"පුතේ, අද හොඳ නැකැත් දවසෙ උඹ මේ ළමයව බැඳ ගනිං! අපි ඔක්කොම යමු කච්චේරියට!" පියා යෝජනා කළේය.

**මව එය ස්ථිර කළාය. මනාලයා යෝජනාව ක්‍රියාත්මක කළේය. මම අත්පොළසන් දුන්නෙමි.**

**නිමි.**

Visit http://www.sinhalamp3.com - for more sinhala e stories

# මහා කසිප්පු සමුළුව

## නරලොව හොල්මන්

Copyright © by

චන්ද්‍ර අනගිරත්න
1965 - 1967



IGCAS www.sinhalamp3.com e Story Book's

සමස්ත ලංකා නීතිවිරෝධි කසිප්පු පෙරන්නන්ගේ ඒකාබද්ධ
වෘත්තිය සංගමයේ

# මහා කසිප්පු සමුළුව

සමස්ත ලංකා නීතිවිරෝධි කසිප්පු පෙරන්නන්ගේ ඒකාබද්ධ වෘත්තිය සංගමයේ 1 වැනි වාර්ෂික මහා සමුළුව, 1965 අගෝස්තු 15 වැනි ඉරිදා මධ්‍යම රාත්‍රියේ 12.30 ට කොලඹ, කනත්තේ සුසාන භූමියේ දී පැවැත්වේ. සංගමයේ අරාධනය පරිදි විශේෂ කල්ලතෝනියකින් වැල්වැටිතුරෙයි හොර වරායට ගොඩබට බලුකිස්ථානයේ කසිප්පු චක්‍රවර්ති, ශ්‍රීමත් අගුවක් පාසා මහතා මුලසුන හොබයනු ඇත.

**න්‍යාය පත්‍රය**

1. සමුළුව ඇරඹීමේ හූව.

2. වාර්තාව ලිවීම.

3. අය වැය ලේඛනය පිලිස්සීම.

4. අලුත් ව්‍යවස්ථාවන් උල්ලංඝණය කිරිම.

5. නව නිලධාරීන් තේරීම (හොර චන්ද මාර්ගයෙන්).

6. යෝජනා (මංගල යෝජනා තහනම්).

7. ජයපානය (කසිප්පු පමණයි).

සැ: යු:

මෙම මහා සම්මේලනයට දහ තුන් දෙනකුගෙන් පමණ යුත් අති විශාල මහා ජනකායක් බලාපොරොත්තු වෙන බැවින්,මෙයට සහාභාගී වීමට පැමිනෙන සියලුම සමාජික මහතුන්, ප්‍රෙවේශ පත්‍ර නොමැතිව නොමිලේ දුම්රියෙන් සහ බසයෙන් ගමන් කිරීවේ වගකීම තම-තමන් විසින්ම උසුලනු ලැබීමට වගබලා ගත යුතුය. එමෙන්ම, මෙහිදී කෙරෙන ජය පානයේදී තමන් පානය කිරීමට කැමති කසිප්පු වර්ගය කුමක් දැයි මා වෙත මෙම රැස්වීමෙන් පසු වහාම දන්වා සිටිය යුතුය.

**යෝජනා**

සංගමයේ ගරු සභාපති විසින් ඉදිරිපත් කිරීමට*

1. කසිප්පු කර්මාන්තය ජාතික කර්මාන්තයක් බවට පත් කරනු වස්,රජයේ සුරා ඒකාධිකාරය නැති කර, පෞද්ගලික කසිප්පු නිෂ්පාදකයාට අත දීමටත්, සුළු කර්මාන්තයක් හා ගෘහ කර්මාන්තයක් වශයෙන් මෙම ජාතික කර්මාන්තය නගා සිටුවීමටත් රජයේ සහයෝගය ඉල්ලා සිටීම.

2. රජයේ සේවකයනට දී තිබෙන අයිතිවාසිකම් සියල්ල අපේ කසිප්පු සහෝදරයන්ටද අවශ්‍යව ඇත. එමෙන්ම, පඩි වැඩිවීම, සතියකට දින අටක නිවාඩු, ලෙඩ නිවාඩු, ප්‍රසූත නිවාඩු, හොරෙන් දුම්රිය දෙවැනි පංතියේ යෑම්-ඊම් දෙකට පමණක් බලපත්‍ර, වෛද්‍ය අධාර, විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික අදී මෙකී නොකී හැම දෙයක්ම බලෙන් හෝ ඉල්ලා සිටීම.

3. ලංකා විශ්ව විද්‍යාලයන්හී කසිප්පු ශාස්ත්‍රය පිලිගත් විෂයක් බවට පත්කිරීම. විනේතෘ පදවියට අපේම මිනිහෙක් දැමීම.

4. අංග සම්පූර්ණ රසායනාගාරයක් සඳහා ගොඩනැගිල්ලක් ලබා ගැනීම. උපකරණ අවශ්‍ය නැත.

5. ගල්ඔය ඉක්ෂුපාක වහාම තහනම් කර එම වෙනුවට එම බෝතල්වල අපේ බීම වර්ග යේදීම.

6. පහත සඳහන් අපේ ජාතික නිෂ්පාදනයන් ලියාපදිංචිකර,

ඒවා පිටරට කැවීමට අවසර ලබාගැනීම:-

"සුදිය, දෙහි සුදිය, ඩඩ්ලිගෙ සුදිය, සිමෙන්ති සුදිය, කිමෝනා සුදිය, මිනී සුදිය, එම්බාම් සුදිය, ස්ප්‍රිතාල සුදිය, ටොප්, ස්භ ටොප්, බ්‍රාහ්මණ ටොප්, තාපසයා, හිටපන් මචං, ගහපන් මචං, අපි යං මචං, අවරෝජන්, සුක්කුතන්නි, සීනි කරීකඳ්කඳං, අලහොද්ද, දිය රෙද්ද, සුදා, බින්නයි, කාබයිට්, ගල්බමුණා, ගුණ්ඩුව, හරිසූර්, මිකාඩෝ, ගල් බඩු, පොත්ගුල, කැල්ටැක්ස්, අබිබගාතයා, අත කොටා, අමරහනන්, එක දෙක, හබරලකොල, රත්නපුරා, කොකාකෝලා, පිච්චුවා, උපකෘත සුදිය, බකස්, වදකහ සුදිය, අලුත් ශතේ සහ ශත හවුල."

8. අපේ දරුවන්ට උප්පත්තියේ සිට වෘතීය අයිතිවාසිකම් ලබා ගැනීම.

9. අපේ නියෝජිතයෙක් එක්සත් ජාතීන්ගේ සංගමයේ ස්ථිර නියෝජිත පදවියට පත් කර ගැනීම.

10. පසුගිය මැතිවරණ කාලයේදී දේශපාලන කටයුතු වල යෙදුණු කසිප්පු නිෂ්පාදකයන්ගෙන් පලිගැනීම් වස් ඔවුන් දුෂ්කර පලාත්වලට මාරු කර යැවීම වහාම නතර කරන මෙන් රජයෙන් ඉල්ලා සිටීම.

**නිමි.**

Visit http://www.sinhalamp3.com - for more sinhala e stories

## මරණ දැන්වීමක්

# නරලොව හොල්මන්

Copyright © by

චන්ද්‍ර අනගිරත්න

1965 - 1967



කව්දෝ දොරට ගසන ශබ්දයක් ඇසී, වහාම විදුලි පහන දල්වා බිට පැන, එහි වූ සරම අඳින ගෙන ඇගලා ගත් මම කවුද? කියා ඇසුවෙමි.

"මං සෑර්!"

"මං කියන්නේ කවුද හමුදාවෙන්ද? පොලීසියෙන්ද? දේශප්‍රේමී සංවිධානෙන්ද? කොටි සංවිධානෙන්ද? ඉන්කම් ටැක්ස් එකෙන්ද? සී.අයි.ඩී එකෙන්ද?"

"ඒ එකකින්වත් නෙමේ සෑර්, මං මේ පීටර් වටලප්පන් නෝනගේ පනිවුඩේකට!".

"මේ රෑ දොලහට වටලප්පන් නෝනට මොකෝ මං ඕනෑ වුනේ? යකෙක් වත් ගැහුවද?"

"නෑ සර් නෝනා කිව්වා විගහට මහත්තයාව අඩගහගෙන එන්න කියලා."

"ඒ මොකටද?"

"ඒ නෝනගෙ මහත්තයා දැන් මැරුනා-"

"ආ.... හොඳ මහත්තයා! කොහෙද? ගෙදරද? ඉස්පිරිතාලේද?"

"ගෙදර! සෙනග පිරෙන්න ඉස්සර මහත්තයාව එක්ක එන්න කියලයි මාව එව්වේ!"

"ඉතිං මගෙන් ඇති වැඩේ ...." යයි මම කල්පනා කරන්නට විමි.

"ගියාම නෝනා කියයි." පීටර් කීය.

"අනුමානයක් නෑ.. හොරට අන්තිම කැමති පත්‍රයක් ලියවාගෙන මිනියේ මාපට ඇඟිල්ලේ සලකුන ගන්න වෙන්න පුලුවං..... කාටත් හොරෙන්!" යැයි මටම කියා ගත් මම එහි ගියෙමි. එය පයින් විනාඩි දහයක ගමනකි.

පීටර් සමග මා ගෙට ඇතුලු වූ විට ඈ මිය ගිය සැමියාගේ ඇඳ ළඟ තනියම සිටියාය. පීටර් කුස්සියට යැවූ ඈ මට ඒ අසලින්ම වාඩි වීමට සැලැස්වූවාය. එවිටම අසල කාමරයක සිට ඇගේ ලොකු මහත් වූ දියණියද අප අසලට අවුත් වාඩි වූවාය.

"කරදර කරාට සමා වෙන්න! මහත්තයාගේ පණ ගිය හැටියෙමයි මහත්තයාට පණිවිඩේ එව්වේ. මේ කනගාටුදායක මොහොතේ අපිට පිහිට වෙන්න කව්රුත් නෑ....වෙන!"

"මරණෙ දැනුම් දෙන්නද....රෙජිස්ට්‍රාර්ට?"

"නෑ"

"මිනී සාප්පුවට?"

"නෑ"

"මුදල් ප්‍රශ්නයක්?"

"නෑ"

"අන්තිම කැමති පත්තරේ?"

"නෑ"

"එහෙනං?"

"අපට පත්තරේටයි රේඩියෝ එකටයි දාන්න මරණ දැන්වීමක් ලියා ගන්න!"

"මේ රෑ මෙච්චර හදිස්සියෙන්? වෙන වැඩ ඔක්කොම තිබේද්දී?" මම පුදුම වී ඇසීමි.

"මෙක පිට කච්රුත් රුැස් වෙන්න ඉස්සර හොරෙන් කෙරෙන්න ඕන දෙයක්, හොඳ සිහි බුද්දියෙන්, හිතට දුක එන්න ඉස්සර, අඩන්න ඉස්සර!" ඈ මගෙන් ඉල්ලා සිටියාය.

ඉතිං මේක ගෙදර අයටම ලියන්න තිබුන ෙන්, අහවලාගේ අහවලා අහවල් දවසේ මළා කියල!"

"ඇත්ත මහත්තයෝ! ඒ වුනාට නියම නම් ගම් ඒ විදියටම ලිව්වොත් අපේ තත්වෙට හරි නෑ. එකයි මහත්තයා ගෙන්නා ගත්ගේ.නම් ගම් අකුරු ලස්සනට ගලපලා ලියවා ගන්න!" කියා ඈ පෑනක් සහ කඩදාසි මට සැපයුවාය.

"හරි කියන්න මං ලියන්නං-"

"දැන් මැරිච්ච මහත්තයාගෙ නම උඩ ගෙදර ඩිංගා. ඒ දවස්වල කරත්තෙනෙ දැක්කුවේ. කසිප්පු බිස්නස් එකෙන් හම්බු කරාට පස්සෙ ෙන් පොහොසත් වුනේ! ඉතිං නම ටිකක් වේනස් කරලා-!"

"හරි මං දාන්නං ඩිංගිරි බන්ඩා උඩ ගෙදර කියලා! සත් ගුණවත් සමාජ සේවක වූ ප්‍රසිද්ධ ප්‍රවාහන නියෝජිත... සහ මොනවද කසිප්පු ෙන්ද නිෂ්පාදනය කලේ?"

"ඔව්."

"ඒක බෙහෙතක්නේ? මං ලියන්නං වෛද්‍යාචාර්ය කියලා."

"එතකොට මං ඇසිලියා..."

"උපන් ගම?"

"මඩගාලේ රේල් ගේට්ටුව ලඟ."

"මං ලියන්නං වාසල මුදලිගේ ඇසිලින් මඩපාත මහත්මියගේ ආදරණීය ස්වාමි පුරුෂයා වූද..."

"මහත්තයෝ මේ මගේ තුන් වැනි මිනිහා!"

"ඒක ලියන්න ඔනේ නෑ. ළමයි?"

"ඕක තමයි මහත්තයෝ ප්‍රශ්නේ.....ළමයි එකොළහක් ඉන්නවා. හැබැයි මේ මිනිහගෙ කියලා කියන්න බෑ ඔක්කොම. ඔය බාල එවුන් ටික ගැන මේ මිනිහා හැම දාම සණ්ඩු කළා."

"කාගේ උනත් කමක් නෑ, මෙයාගෙ ළමයි කියලා දාමු. මැරිච්ච මිනිහා මගෙ නෙමෙයි කියලා කෑගහයි කියලයෑ?"

"හොදයි මහත්තයෝ ලොකුම පුතා පේමා...දැන් හිරේ පස් අවිරුද්දකට..."

"මං ලියන්නං ජයම්පත් - බන්ධනාගාර දෙපාර්තමේන්තුව!"

"දෙවැනි ඒකී මාළු ලෑල්ලක් දාගෙන ඉන්නවා - මෝදර වැල්ලේ....නම යසෝ!"

"යස්මින්. . .  ධීවර දෙපාර්තමේන්තුව! ඔව් ඊලඟට?"

"තුන්වැනි පුතා ඇන්ඩා.... ඌ ගැට කපනවා"

"ඇන්ඩaa... දේශීය ආදායම් දෙපාර්තමේන්තුව!"

"හතර වැනි එකා උස්වැටකෙයියාව වැල්ලේ.. ඔය පෙම් ජෝඩු බය කරලා චේන් ඔරලෝසු එහෙම කඩා ගන්නවා. උගෙ නම විලී."

"විල්සන් යු.කේ. ඔව්!"

"පස් වැනි එකී නංනත්තාරේ යනවා - එපා කිව්වට අහන්නෙම නෑ! නම සොපී."

"සොෆායා.... සංචාරක මණ්ඩලය - ඔව්!"

"හය වැනි එකී සල්ලි පොලියට දෙනවා. නම ජෝසී."

"ජොසපින් - උකස් හා ආයෝජන බැංකුව! ඔව්."

"හත් වැනි එකා ඩගියා ඌ කොල තුනේ සූදුව තමා, ඌගේ වැඩේ!"

"ඩග්ලස් ... ලොතරැයි මණ්ඩලය."

"අට වැනී එකා කුඩු විකනවා. උගේ නම ජුවා."

"ජයවන්ත ...රාජ්‍ය ඖෂධ සංස්ථාව!"

"නව වැනියා පිනා... හොර සම්මාදමේ යනවා"

"පුණ්‍යවන්ත... මුදල් අමාත්‍යාංශය!"

"දහවැනි එකී ගෙදර , මේ ඉන්නේ මැගී!"

"මාගරට්. ගෘහකර්මාන්ත දෙපාර්තමේන්තුව"

"එකොලොස් වැනි එකා පිහියා ඇනුම් පාරක් කාලා ඉස්පිරිතාලේ. නම මහතුන්!"

"මහන්තා... සෞඛ්‍ය දෙපාර්තමේන්තුව!"

"ඔය තියෙන්නේ මරණ දැන්වීම නියමෙට ලියලා." ඈ මරණය අමතක කර සතුටින් සතුටට පත් වුවාය.

"දැං මහත්තයෝ, ඔය විදියට ලියලා පත්තරේටයි රේඩියෝ එකටයි යවන්න.දැං වැඩේ හරි! භය නැතුව අඩන්න පුලුවන්! අනේ මගේ රත්තරං නැතෝ! අනේ මාරයා, මාවත් අරන් පලයෝ," කියමින් ඇය මහ හඩ දී හඩන්නට වන් කල, අසල්වැසියෝ කඩාගෙන බිදගෙන මරණ ගෙදරට රැස්වන්නට වූහ. මම හීන් සීරුවේ ආපසු ගෙදර ආවෙමි.

**නිමි.**

Visit http://www.sinhalamp3.com - for more sinhala e stories

## මගේ පෙම්වතිය අම්මට අසුවී

# නරලොව හොල්මන්

Copyright © by

චන්ද්‍ර අනගිරත්න

1965 - 1967



නෝරා සහ මා අතර ප්‍රේම සම්බන්ධයකට මුල පිරුණේ අප දෙදෙනා කැළණි ගගේ නා අවසන් වී ගොඩට එන ගමන්ය.
එනිසා එය පවිත්‍ර ප්‍රේමයක් විය. මගේ 13 වැනි කුලුදුල් ප්‍රේමය ද එය වූ බැවින්, මගේ අනෙක් පෙම්වතියට අසු නොවන්නට
ඇය සමග ප්‍රසිද්ධියේ රවුම් ගැහීම මට ලොකු ප්‍රශ්නයක්ය. මේ නිසා මා ඇය හඳුන්වා දෙන්නේ මගෙ නංගී කියාය. මා තමාගේ අයියා බව ඇඳ අනුන්ට පවසයි.

"දැං ඔයා නැති අතරේ ගෑනු කෙනෙක් ඇවිල්ලා මගෙන් අහුවා ඔයා කවුද කියලා," කියමින් නෝරා බංකුවෙන් නැගිට, මුහුදු සුලග නිසා ඇවිස්සුනු හිස කෙස් සකස් කරන්නට වූවාය.

"ඉතිං?" මම ඊට එහා බංකුවේ සිටි කෙල්ල දෙස බලාගෙනම නෝරාගේන් ඇසුවෙමි.

"මම කිව්වා අයියා කියලා"

"එක හොඳයි"

"එක් කුසේ උපන් අයියද කියලා එ ගෑනි ඊට පස්සේ අහුවා"

"ඉතිං"

"මං කිව්වා ඔව් කියලා"

"කොයි වගේ ගෑනියක් ද?"

"ටිකක් වයසක පහේ කෙනෙක්. ටිකක් සුදුයි - උසයි - මහතයි - අවුරුදු පනහක් නැත්තං - හතලිස් පහක් විතර - අන්න අර එන්නේ එයා තමයි!" කියා ඈ ගෝල්පේස් හෝටලය පැත්තට අත දිගු කලාය. මම එ දෙස බැලීමි.

"දෙයියෝ සක්කි!" මම වෙව්ලන්නට විමි.

"ඇයි චන්ද්‍රා?"

"එ අපේ අම්මා!"

"අම්මා!"

"ඔව්" කියා මම නෝරාගෙන් ඈත්ව ගෝල්පේස් පට්ටනියේ මුහුද අද්දර බැම්ම ලගට විමි. අම්මා ලගට එයි. ඇගේ කට හඬ මට ඇසෙයි.

"අවුරුදු තිහක් උගන්වල මම දැන් පැන්සොන් යන්නත් කිට්ටුයි - තවම මට බැහැ නේ පහට ගණන් කරන්න. ඕං මගෙ දැනුමේ හැටි - මං වගේ මොඩියක් ඉන්නවද! අනේ ඇත්තට!"

"ආ - අම්මේ!"

"ඔව් පුතා - මං මේ කියනනේ ගණන් වරදින හැටි!"

"ඇයි අම්මේ සල්ලිවත් නැති වුණා ද?" මම හිතේ බිය සගවාගෙන බොරුවට ප්‍රශ්න කෙළෙමි"

"නැ - මං මේ කියන්නේ මේ මට ඉන්න ළමයි ගාන මතය නැති

හැටි! මං හිතුවේ මට ඉන්නේ දුවල දෙන්නයි, පුත්තු දෙන්නයි
– ඔක්කොම හතර දෙනයි කියලා – දැන් බැලින්නං මට තවත්
දුවෙක් ඉන්නවනේ – මං අද නේ මගෙ දූව දැක්කෙ! කෝහේන්ද පුතේ නංගි
හොයා ගත්තේ?"

නෝරා බිම බලාගෙන දකුණු කකුලෙන් පොළොව හාරයි මම ද සපත්තුවේන්
පොළොව හාරන්නට වීමි.

"මොකෝ වල් ඌරා වගේ හාරන්නේ හැංගෙන්නට ද? එ වේන
අම්මලාට. මට හංගන්ට උඹ හිතුවා මදි පූතේ. මං උපන්නේ උඹට ඉස්සර – ".

"නෑ!"

"කට වහපිය පැහිච්ච කම් නැතුව. තව එනව මයෙ එක්ක
විහිලු කරන්න. තො ටෙක්නිකල් එනවා, ලයිබේරියට එනව, පංතියට එනව,
ප්‍රැක්ටිස් වලට එනව – අරකට එනව මේකට එනවා මගෙ පනං හතර කඩාගෙන
මේකද මේච්චර දවස් කරේ? හොඳ ලයිබ්රිය – නොදකිං ඌරා – කොහෙන්ද
තෝ මේ තුවක්කුව හොයා ගත්තේ?"

නෝරා ටිකක් ඇත් වුවාය. මම තවත් හාරන්නට වීමි.

"තෝ ගොම දැකලා තියෙනවද?"

"ඔව්."

"මාසෙ පෝය දැකල තියෙනවද?"

"ඔව්."

"තෝ කොච්චරවත් ළිප් බොක්කට රිංගන එකා දුම දැකලා
තියෙනවද?"

"ඔව්" අම්මා කුමක් සඳහා ප්‍රශ්න කරන්නේ දැයි නොදැන
මම බිම බලාගෙනම උත්තර දුනිමි.

"ලාම්පු දැලි දැකලා තියෙනවද?"

"ඔව්."

"එහෙනං ගොන් වස්සෝ, තෝ මේ තාර පීප්පෙ කරේ
දාගෙන දගලන්නේ තෝගෙ ඇස් පොට්ට වේලාද? රටේ
ගෑනු නතුවද තෝ මේ උරවක්‍රමාලේ කරේ දා ගත්තෙ – යකෝ
පාරේ අඩගහගෙන යන්න පුලුවන් එකක්ද – අස් ඇරල බලපිය
– ගලවපිය ඔය සන්ගලාස් එක –ෂෝක් එකනං මොකද – නයිලෝන් කමිසෙයි,
රිස්ලට් එකයි, පැනෙල් කලිසමයි ඇඳගෙන
ඒජන්ත හාමුදුරුවන්ගේ පුතා වගේ පාරට බැස්සම – මෝඩියො
හිතනවා හොඳ ඉල්ලමක් කියලා – එ වුණාට තවම රස්සාවක් නෑ – යකෝ තොට
පුලුවන්ද ගෑනියෙකුට කන්න අඳින්න දෙන්න – කියාපිය තොට පුලුවන්ද කියලා!"

"පුලුවන්!"

"පුලුවන්? තොගේ අප්පගේ තට්ටෙ උකස් තියල ද? අෑ
ගොන් තඩියෝ –"

"නෑ"

"එහෙනං?"

"අපේ පවිත්‍ර ප්‍රේමය -"

"සන්තානං මෑනියන්ටම ඔප්පු වෙච්චාවේයි - අනේ බොල -
පවිත්තර පෙරේමෙ! - ඔය පවිත්තර පෙරේමෙන් තොට පුලුවන්ද කරපිංච
නැට්ටක් ගන්න! මං කියන්නේ තොගේ ඔය
කලිසමට අල්ලන බොත්තමක් ගන්න පුලුවන්ද? නැත්තම්
තොට හෙම්බිරිස්සාවක් හැදුනම කොත්මල්ලි ඇට දෙකක්
ගන්න පුලුවන්ද? නැත්තං ඔය පවිත්තර පෙරේමෙ උරච්චි කරල
බොන්න පුලුවන්ද? තොට හරි ඒකිට හරි බඩේ කැක්කුමක් හැදුනම - ඈ
නරියො? වර යන්න ගෙදර - තොට ඔච්චර
මනමාල පිස්සුවක් වැහිල තියෙනව නං මං හොයල දෙන්නං -
අත ඇරල දාපිය ඔය මළ ඉලව්ව!"

"බෑ."

"ඇයි බැරි?"

"දැං පස්ස ගහල බෑ"

"ඇයි?"

"එතකොට කිසිම සුගතියක් නෑ අම්ම!"

"තොගෙ කටේ තියෙන්නෙම ඔකමයි. මදෑ හොයාගෙන තියෙන සුගතිය!
වර යන්න ඒකි ලගට - මං කතා කරන්නංකෝ?" කියා අම්මා මගෙ කනෙන්
අල්ලාගෙන මා නෝරා ලගට ඇදගෙන යන්න වුවාය.

"අත අරින්න අම්මා - මිනිස්සු බලා ගෙන ඉන්නවා නේ"

"එකට කමක් නෑ! තෝ එකිත් එක්ක මෙතන කොමලෙ දාගෙන
ඉනන කොට මිනිස්සු බලාගෙන හිටියෙ නැද්ද?"

"මට ලැජ්ජයි අම්ම!"

"තොටද ලැජ්ජයි කියලා එකක් තියෙන්නේ! හයියෙං කියන්ඩ එපා
මිනිස්සු හිනා වේයි!" කියා අම්මා මගේ කන අත ඇරියාය.
දැන් අම්මා සහ නෝරා මගේ දෙපැත්තේය.

"මේ ළමයා - මූ මගේ පුතා වුණාට මොකද මූ අන්තිම එපා කරපු
එකෙක් - මොනවා හරි තියෙනව නං අත් ඇරලා දාන්ඩ දැන්මම
- ඔය ලමයගෙ හොඳටයි කියන්නේ."

"මට බෑ - අපි දෙන්නා දැන් හුගාක් දුර ගිහිල්ලා තියෙන්නේ."
නෝරා කට ඇරියාය.

"වත්තල ඉඳං කොලඹ අවාම එච්චර දුරක් ගියා කියනනේ
කොහොමද? මං ඕන නං ආපහු ඇරලන්නං!" අම්මා තරහෙන් කීවාය.

"එයා මාව බඳිනවා කියලා තියෙන්නේ ජර්මනියේ ගිහිල්ලා ආවාට පස්සේ."

අම්මා මා වෙත හැරුණාය. "කවද්ද තෝ ජර්මනියෙ යන්නේ -
ඈ බත් කන බූරුවෝ? තෝ එක කෙල්ලෙකුට කිව්වේ ප්‍රන්සේ
ගිහිල්ලා ඇවිල්ලා බඳිනවා කියලා - තවත් කෙල්ලේකුට එංගලන්තෙ!
තවත් කෙල්ලෙකුට ඇමරිකාවේ! තවත් කෙල්ලෙකුට රුසියාවේ කියලා!
මම දන්නෙ නෑ කියල. තොට කොලඹ එන්න ශත විසි පහ දෙන්න ඕනෙත් මම
-
ජර්මනියේ යන්න! සල්ලාලයා!!" කියා අම්මා නෝරා දෙසට හැරුනාය.

"ආයේ මොනවද මේ පිංගුත්තරයා මේ ලමයාට කියලා තියෙන්නේ"

"අක්කා බැන්දං පස්සේ එයා විතරලු ගෙදර ඉන්නේ. ගේත් ලොකු කරලා හදනවලු. ඕල්ඩ් මැනුයි ඕල්ඩ් වුමනුයි - ඒ කියන්නේ එයාගේ අම්මයි තාත්තයි විරුද්ධ වුනාට කමක් නෑ කිව්වා - එයාට අච්චිගෙන් අක්කර දෙසීයක පොල් වත්තක් හම්බුවේලා තියෙනවලු - ගැරේජ එකක් තියෙනවලු ප්‍රින්ටිං ප්‍රෙස් එකක් තියෙනවලු-ඒක බලා ගන්න විශ්වාස කෙනෙක් නෑල්ලු - මං බැන්දම මට ඒක බලා ගන්න දෙනවලු"

"තූ නොදකින් මෙහෙමත් පචයෙක් - මූ ලෝක පචයෙක්!" කොහෙද බොල තොගේ ඔය ප්‍රින්ටිං ප්‍රෙස් එක තියෙන්නේ?"

"නෑ එහෙම කියන්න එපා! එයා මගේ පෙම්වතා!"

"මූ වසවර්ති මාරයෙක්! මට පුලුවන්නං ඕකගේ බෙල්ල මෙතෙන්දිම මිරිකලා දාන්න! ඇත්තට ඌරා! ඌරා! ඌරා"

"අනේ මගෙ චන්ද්‍ර - මං එයාට ආදරෙයි - එයා නැත්තං මං මැරේනවා - මොනවා හරි බොනවා! මට මෙයා නැතුව ඉදලා වැඩක් නෑ - ඉහි - ඉහි - ඉහි!" නෝරා අඩන්ට වුවාය.

"තෝ පෙති ගහනවා! අවලං පෙරේතයා! හැටි අහැටුල්ලා වගේ! වර යන්න මස් කඩේට බාර දෙන්න මී හරකා!" අම්මා මා දෙස රවාගෙන බනින්න ගත්තාය.

"මගේ සුදු චනද්‍රට එහෙම කියන්න එපා - මං මැරේනවා මැරේනවාමයි කියාගෙන නෝරා බේරේ වැව දෙසට දුවනනට පටන් ගත්තාය.

"තෝ හින්දා මට නවනිංගිරියාවේ බෑ - මං මැරෙනවා මැරේනවාමයි!" කියාගෙන අම්මා පාරේන් එහා පැත්තට පැන්නේ පාර දෙපැත්ත හොද හැටි බලා ඉතා ප්‍රවේශමිනි.

දැන් අප තිදෙනම බේරේ වැව් බැම්ම අසලය. පර්ලිමේන්තු ගොඩනැගිල්ලේ පඩි පෙළේ සිටි මන්ත්‍රීවරුන් සහ වැවේ ඉබ්බන් අප දෙස බලාගෙ හිටින හැටි මට පෙනේ.

"මං පනිනවා වැවට!" නෝරා බැම්මට අත තිබ්බාය.

"නැ ඔය ලමයා පනින්න ඕනේ නැ - මේ කාලකණ්ණියා වදපු මමයි පනින්න ඕනේ!" අම්මාද වැව් බැම්මට අත තිබ්බාය.

"ඔය දෙන්නම පනින්න ඕනේ නෑ - මං නේ එපා කරපු එකා - මං පනින්නං!" කියා මම බැම්ම උඩට නැග්ගෙමි.

"අනේ රත්තරනේ ඔයා පැන්නොත් මාත් පනිනවා" කියා නෝරා මගේ කකුල් දෙකේ එල්ලුනාය. මම කකුල් දෙක ගසා දමා දගලද්දී කයේ සම බර හීන වී "ජ්බෝස්!" ගා බේරේ වැවට ඇදගෙන වැටුණෙමි. මම දිය යටට ගිලුණෙමි. ඉබ්බෝ මා වටකර ගත්හ.දියට සහ ඉබ් මසට පුරුදු මට ඉබ්බන් සමග තප්පර කිහිපයක් දිය යට සිටීම සුළු දෙයකි.

"ජබාස්" යනුවේන් තවත් යමක් දියට වැටුනි. "අයියෝ නෝරා!" කියා මට ඉබේටම කියවුන අතර, ලුනු වතුර මගේ කටටත් නහයටත් ඇතුලු විය. මම වහාම ඇය අල්ලාගෙන මතුපිටට ආවේමි. වැව් බැම්ම අල්ලා ඇය ගොඩට ගත්තේමි. දෙයියෝ සාක්කි! මා වතුරේන් ගොඩට ගෙන ඇත්තේ අම්මාය! නෝරා ගොඩ!

නෝරා බැම්ම අයිනට වී මා දෙස රවාගෙන සිටී.

"බලන්ඩ ඔයා වතුරට පැනපු පාර මගේ ඇග හැම තැනම වතුර ඉහිරිලා. සාරිය ඔක්කොම තෙමුනා! මං කොහොමද පාරේ බැහැලා යන්නේ - එකට කමක් නෑ රත්තරං මං ඔයාට ආදරේයි!" ඈ සාරිය සකස් කරන්නට වූවාය.

අම්මා මා දෙස රවාගෙන සිටී. "ඌරා ! කාලකණ්ණී පෙරේතයා - වර ගෙදර යන්න මං තෝ මස් කරනවා!" කියමින් අම්මා සාරියේ වතුර මිරිකන්නට වුවාය.

"එන්න සුදූ!" නෝරා මගේ අත ඇල්ලුවාය.

"වර ගොන් වස්සා තොගෙ හම ගලවන්න-" අම්මා මගේ අතින් ඇද්දාය.

සැබෑ ආදරය ඇත්තේ වචන වල නොවන බව අත් දුටු මම ගොනා සේ අම්මා පස්සේ වැනි වැනී ගමන් කලෙමි.

# නිමි.

Visit http://www.sinhalamp3.com - for more sinhala e stories

"මිශ්‍ර පාසල් තිබෙන තාක් ගුරුකම අත් නොහරිමි"

# නරලොව හොල්මන්

**Copyright © by**

**චන්ද්‍ර අනගිරත්න**

**1965 - 1967**



**IGCAS** www.sinhalamp3.com ⓔ Story Book's

මා රක්ෂාව වශයෙන් ගුරු වෘතිය තෝරා ගත්තේ හුදෙක් නොමිලේ බනිස් කෑමට ඇති තණ්හාව නිසා බව සමහරු පවසති. කුඩා කල පටන් ඉගෙන ගැනීමට කිසිම දක්ෂකමක් නොතිබුණු හෙයින් මට ගුරුවරයෙකු වීමට පුලුවන් වූ බව තවත් කෙනෙක් අදහස් සිතයි. මිශ්‍ර පාසල් තිබෙන තාක් මා ගුරුවරයෙකු වශයෙන් සේවය කරනු ඇතැයි තවත් කෙනෙකු අදහස් කරයි.

ලෝකයෙන් උතුම් රට වන ලංකාවේ ශ්‍රී විභූතිය හා ස්වාභාවික සෞන්දර්ය්‍යය නැරඹීම සඳහා එක් එක් දුෂ්කර පලාත්වලට මාරු වී යාමට ආශාවෙන් දේශපාලන කටයුතුවල යෙදීමට මා ගුරු වෘතිය තෝරාගත් බවට සමහරු අදහස් දක්වති. කවුරු කෙසේ කීමත් මට කමක් නැත මා ගුරුවරයෙකු වූයේ ආහාර වගා කොට. ගොවි තැනින් සමෘධිමත් කොට ස්වයංපෝෂණය කිරීම සඳහා බව මගේ හෘද සාක්ෂිය දනී. මට ඒ ඇති! නාගරික ඉංග්‍රීසි පාසලක අධ්‍යාපනය ලත් මට ගොවිතැනි කටයුතු ගැන අල්ප මාත්‍රයක දැනුමක් හෝ නැති බව මම පිලිගනිමි. එහෙත්, අපේ විදුහල්පති තුමා පාසලේ ගොවිතැන් කටයුතු මා හට පැවරූයේ මේ ලෝකේ දෙයක් ඉගැන්වීමට පුලුවන්කමක් මට නැති නිසා, මා ලබන පඩියට මොනවා හරි වැඩක් මා ලවා කරවා ගත යුතු බැවිනි.

දැන් අපේ පාසලේ ඉතාමත් ජනප්‍රිය විෂය වනාහී කෘෂිකර්මය වේ. මේ නිසා අනෙක් සෑම ගුරුවරු ගුරුවරියක්ම පුරුදු පරිදි නිකම්ම කාලය ගෙවන අතර, හැම පන්තියක්ම මා පස්සේ වැටී උදේ සිට රෑ වෙන තුරු ගොවිතැන් කිරීම නිසා අපේ පාසලේ ඇති එකම උදැල්ලට නිවනක් නැත. තව උදලු කිහිපයක් දෙපාර්තුමේන්තුවෙන් ලබා ගැනීමට මා අදහස් කළෙ නමුත්, මගේ ගොලයන් කියා සිටියේ, "මොකටද සර් - මේ ඇති! නිකං අපරාධෙ ආණ්ඩුවට පාඩු කරන්නේ ඇයි?" කියාය. මම ඔවුන්ගේ කීම පිලිගතිමි.

මා ගොවිතැන් කටයුතුවල යෙදීම නිසා ගුරු මණ්ඩලය අතරද මම ජනප්‍රිය වෙමි. සංගීත ටීචර් ආටි මාස්ටර් සමග කෙමළ කරන තෙක් හතෙ ළමයි මා සමග බතල කොටුවට වී බඩ රිදෙන තෙක් බතල ගිල දමති. භූගෝල ටීචර් ඉතිහාසය මාස්ටර් සමග නාට්‍ය පුහුණු වන තෙක් පස්වැන්නේ ලමයින්ට ඉලක්කයට රට අඹ ගහට ගහට ගල් ගැසීමට මම උපදෙස් දෙමි. මෑතදී විවාහ වූ මැහුම් ටීචර්

නූල් වලින් බබු ගව්මක් ගොතන තෙක් ඈගේ පංතියේ ළමයි මගේ උපදෙස් පිට. ජම්බු, ඇඹුල් පේර, ඇඹරුල්ලා, වෙරළු ගැට සහ දුඹුක් සියබලා කරල් කඩා ඈයට බාර දෙති. විදුහල්පති තුමා බංගලාවට වී "කෙයාර් පිටි" විකුණා කිරි හිගය මග හරින තෙක් මගේ ගෝලයෝ ඔහුගේ පොල් කඩා බජාර් එකට ගෙන ගොස් විකුණා මටද "බ්‍රිස්ටල්" රකක් ගෙන ඒමට අමතක නොකරති. මා ළමයින් ලවා කුරුම්බා කඩවන විට මුළු ගුරු මණ්ඩලයම කෘෂිකර්මය නගා සිටුවීමට පංති කාමරවලින් එළියට බසිති.

පළමු වාරයේ වැඩ හුරුවීමේ දිනයේ කර්නේලිස් අයියාගේ කසිප්පු ඉස්කාගාරයේ කසිප්පු බෝතල් කිරීමද, හොර සම්මාදමේ යාමද,බඩු හැංගීමද, පගා ගැහීමද, ආදී නොයෙකුත් වැඩ හෙදරවීමේ පිලිබඳ අවබෝධයක් මගේ ශිෂ්‍ය ශිෂාවන්ට ලබා දීමේදී මගේ පළපුරුද්දෙන් ලත් දැනුම මහෝපකාරී වුයේය.

දෙවැනි වාරයේ වැඩ හොර වීමේ දිනයේ විදුහල්පතිගෙ නිවසේ උළු කැට 67 ක් ද,පිගන් 26 ක් ද, විදුරු 18 ක් ද. වළං 17 ක් ද, සීනි බෝතලයේ මූඩියද, පොල් කට්ටක්ද බිඳ දමා වාර්තාවක් පිහිට වු මගේ ශිෂ්‍යයන් විදුහල්පතිගේ කලිසමේ බොත්තම් 4 ක් ද ඔහුගේ හාමිනේගේ ගවුමක ගාන්චුවක් ද කඩා දැම්මේ ඒවා සෝදන ගමන්ය. මෙවර වැඩ හුරුවීමේ දිනයේ මගේ ශිෂ්‍යාවන් ලවා ගුරු මණ්ඩලයට පාඩම් කියා දෙන ලදි.

පලාතේ ගොවීන්ට අපක්ෂපාත ලෙස මගේ ගෝලයන්ගේ සේවය ලබාදීම මගේ බලාපොරොත්තුව වූ නමුත් ග්‍රාමසේකර මහතා සහ කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැන මගේ ගෝලයන් ලවා වැඩ කරවා ගැනීමට තෝරා දුන්නේ ආන්ඩු පක්ෂයට පන්දම් අල්ලන කෙනෙකුගේ කුඹුරකය. මේ බව දැන ගත් මගේ ගෝලයින් කුඹුර සී සෑමේදී නගුල් හතරක්ද, බාල්දි දෙකක්ද, මීහරක් බානක්ද, ගම රාලගේ අමුඩය ද, ගම හාමිනේ ගේ හවරියද, ගම දුවගේ කොන්ඩා පටියද මඩෙහි යට කර දැමු අතර ගොයම් පැල සිටවීමේ යෙදුනු මාගේ ශිෂ්‍යාවන් කර ඇත්තේ මුල් උඩට සිටින සේ ගොයම් දල්ල මඩේ යට කිරීමය. මේ නිසා එකී කුඹුරු හිමියාට යල කන්නෙදීම දෙවරක් කුඹුරු වැපිරීමේ භාග්‍යය උදා වුයේය.

තවද ගොයම් පැළැටි නෙලීම සඳහා මගේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් යොදවන ලද කඹුරක වල් ඉතිරි කර ගොයම් පැල පමණක් ගලවන ලද බැවින් මෙවර එහි තණකොල අස්වැන්න ඉතා සාරවත් වු අතර, මා කල උදව්වට කලෙහි ගුණ දැක් වීමක් වශයෙන් කුඹුරු හිමියා කඹුරු පණතට අනුකූලව කපන ලද

තණකොළවලින් තුනෙන් දෙපංගුවක් මගේ සහ මගේ ගොලයන්ගේ ප්‍රයේජනය තකා පාසලට ගෙනවිත් බාර දුන්නේය. විද්‍යාලයට ලබෙන සෑම දෙයක්ම තමා සතු කර ගැන්මට පුරුදුව සිටින විදුහල්පති තුමා මෙම තණකොළ තොගයද තමාගේ ප්‍රයෝජනය සඳහා වෙන් කර ගත්තේය.

මෙවර මහ ගොවි තැන පටන් ගැන්මට පෙර පලාතේ සෑම ගොවියෙකුම වී බුසල් දෙක බැගින් මා වෙත එවා. තමන්ගේ කඹුරුවල හතර සීමාකට අඩිය නොතබන මෙන් මගෙන් විශේෂ ඉල්ලීමක් කර ඇත. මේ අතර, විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකුම මා ආණ්ඩු පක්ෂයේ ජන්ද කොට්ඨාශයකට මාරුකර යැවීමට බොහෝ උනන්දුවෙන් යුතුව කරගෙන යන බවත්. එසේ කළහොත් එම ආසනය ලෙහෙසියෙන්ම වමට හරවා ගැනීමට පුළුවන් යැයි ඔවුන් අදහස් කරන බවත් මට දැන ගන්නට ලැබුණි.

තවද, මා වහාම මේ පළාතෙන් පිටට මාරු කළ යුතු යයි පළාතේ ගොවියන විසින් යෝධ පෙත්සමක අත්සන් කර ගෙන යනු ලැබේ. මෙම පෙත්සමට වැරදීමකින් මම ද අත්සන් කෙළෙමි.

**නිමි.**

Visit http://www.sinhalamp3.com - for more sinhala e stories

# ප්‍රේම පුරාණය

# නරලොව හොල්මන්

**Copyright © by**

**චන්ද්‍ර අනගිරත්න**

**1965 - 1967**



ජිවිතයේ ලොකුම විහිළුව ආලයයි. මෙම විහිළුව දික් ගැස්සුණහොත් විවාහයෙන් ඇස් රතු වේයි. කාමය නැමති අවලම් ශාරීරික අවශ්‍යතාවයේ චෛතසික නියෝජිතයා වන රාගය විසින් මෙහෙයවනු ලැබ,ආදරය නැමති කෑදරකමින් මත් වී, ප්‍රේමය නැමැති සෙමදානයෙන් විඩාවට පත්ව ආලය නැමති සෙවලංකෘත මනෝරාජ්‍යයේ කිරුළ පතා විවාහය නැමැති මුලුතැන්ගේ සදාකාලික ලෙස හැලි වළං සේදීමට මම ද සූදානම් වීම්.

මේ අනුව මම මගේ නෑනාට පිරිසිදු සිතින් අවුරුදු ගණනාවක්ම ප්‍රේම කෙළෙමි. එහෙත් විවාහයෙන් මගේ ප්‍රේමය අපිරිසිදු නොකිරීමට ඈ අන් අයකු හා විවාහ වූවාය.

පාසල් ශිෂ්‍යාවන් ගණනාවකට මම ප්‍රේම කෙළෙමි. එහෙත් වර්ෂය මුලදී පොත් පත් හා ලිපි ද්‍රව්‍ය ආදිය මාගෙන් ලබා ගනිමෙන් පසු ඔවුන් මා අමතක කලේ ඉගෙනීම ගැන පමණක් හිත යෙදවීමටය.

"චන්ද්‍ර , ජිවිතේ ඉස්සරෝම මං ආදරේ කළේ ඔයාට –" යයි රූපා දහස් වරක් මා සමග කියා ඇතැත්, මා සමග එක් වීමට ඇයට තිබූ බාදාව නම් අයෙගේ සුවාමිපුරුෂයා සහ දරුවන් පස්දෙනාය.

බටනලාව වයන ගමන් හාදුවක් දීමට මා අපොහොසත් වූ බැවින් නන්දා මා සමග අමනාප වූවාය. එහෙත් චම්පා මා සමග තරහ වූයේ, සිගරට් එකක් තොල අග රඳවා මා ඇයට හාදුවක් දුන් නිසාය.

දිනක්, බසයක මා ඉදිරියෙන් අසුනක සිටි සුරූපි කාන්තාවක් දැඩි මිත්‍රත්වයකින් යුතුව මා සමග සිනාසේනට වූවාය. මෙයින් දැඩි අඩම්බරයකට පත්ව පහතට හිස හැරවූ මට දක්නට ලැබුණේ මා ඇඳ උන් කලිසමේ වැදගත් තැනක් ඉරී තිබුන අන්දමය.

අනෝමා කලුය. මා ඇයට "සුදූ" කියා කතා නොකල නිසා ඈ මගෙන් වෙන් වූවාය.

මා කලිසම් කාරයෙකු බැවින් අනුලා මට පෙම් කලාය. එහෙත් නිදා ගැනීමට යන විට මා සරම ඇඳගන්නා බවට කව්දෝ කී කේළමක් නිසා ඕ මා අත් අත් හැර දැම්මාය.

අමිතා ඇගේ මුළු හදවතම මට පිදීමට සූදානම් වූවාය. එහෙත් මා ශල්‍ය වෛද්‍යවරයෙකු නොවන හෙයින් ඇගේ ආදරය මට අහිමි විය.

"මගේ ආදරේ පිරිසිදුයි –" කියා අමරා පැවසුවාය.

"නමුත් ඔයා අපිරිසිදුයි –" මම කීවෙමි. ආලය එයින් කෙළවර විය.

මම නර්ස් නෝනා කෙනෙකුට ප්‍රේම කෙලෙමි. දිනක් ඉතා ආදරයෙන් මා ඇගේ අත අැල්ලූ කල, ඈ "ප්ලීස් ඩොක්ටර්, නොටි නව්!" යයි ඇය කීවාය. මට ඈ එපා විය.

මා සමග විවාහවීමට ආශාකල චිත්‍රා මට නිතරම කීවේ දරුවෙකු නැත්නම් විවාහය සාර්ථක නැති බවය. එයට එකග වු මම
" අපි දරුවෙක් ඉන්නවාද බලල සාර්ථක විවාහයකට මුහුණ දෙමු!" යැයි යෝජනා කෙළෙමි. ඈ රට විරුද්ධ වුවාය. මට ඈ එපා විය.

"චනද්‍ර, ඔයා වෙනුවෙන් මගේ ජිවිතය වුනත් පුදන්න ලෑස්තියි!" කියා දයා කීවාය. එහෙත්, "මළකඳකට ප්‍රේම කරන මිනිමරුවෙකු වීමට මට බැහැ", කියා මම ඇයගෙන් ඈත් වූයෙමි.

අජන්තා සමග චිත්‍රපටියක් බැලීමට ගිය මා චිත්‍රපටි ශාලාවේදී චිත්‍රපටිය දෙස බලා සිටි හෙයින් ඈ මා අප්‍රිය කලාය.

"අනේ චන්ද්‍ර, මට මොකවත් එපා. මට ඔනේ ඔයා විතරයි!"
කියා කුසුමා පැවසූවිට, මම වහාම මගේ සපත්තු කුට්ටමත්, මේස් කුට්ටමත්, බැනියමත්, කමිසයත් ගැලවීමි. ඈ වහාම මගේ අත් දෙකින් අල්ලාගෙන "එපා ආයෙ ගලවන්න එපා - මට ඔයා ඔනේ අඳුමුත් එක්කයි!" කියා මා නතර කලාය. මට ඈ එපා විය.

නිතා සමග මුහුදු වෙරලට ගිය මම මුහුදට පස්ස හරවා වාඩි වී ඇය සමග කතාවට වැටුනෙමි. ගසා ආ මුහුදු රල වැදී මගේ කලිසමේ පස්සා පැත්ත හොඳටම තෙමුනි "හරීම රසවත් සිද්ධියක් නේද!" කියා ඈ සිනාසෙන්නට වුවාය. "ඔව්, හැබැයි ලුණු රසයි!" කියා අතේ තිබුණු සඟරාවෙන් පස්ස වසාගෙන මම ඈගෙන් වෙන් වුයෙමි.

"ආදරය පැනි රසයි!" කියා නාලිනී මට තුරුලු වු නමුත් දියවැඩියාවට බියෙන්, මම ඇගේ ආදරය ප්‍රතික්ෂේප කෙළෙමි.

මා සමග ප්‍රේම සම්බන්ධයක් පැවැත්වූ ගුරුවරියක් මට එපා වුයේ, මා ඇයට යැවු පෙම් ලිපියක් හරි වැරදි බලා රතු තීන්තෙන් ලකුණු දමා ආපසු මට එවු නිසාය.

ටැලිපෝන් සේවිකාවක් මා සමග ප්‍රේමයේන් වෙලී සිටිය නමුත් මා ඇයට කතා කල කීහිප වතාවකම ඇය උත්තර දුන්නේ,
"සොරි, අයි ඈම් එන්ගේජ්ඩ්!" කියාය. මම ඇය අත් හලේමි.

ටයිප් ගසන්නියක සමග සම්බන්ධයක් පැවැත් වු මට ඇය එපා වුයේ, ඇය නිතරම මගේ ඇගට කොටන්නට වු නිසාය.

දැන් කිසිම ප්‍රේම සම්බන්ධයක් නැතිව මා හුදකලාව කල්පනා කරමින් සිටින්නේ මගේ කුලුදුල් ආදරය පිදීමට සුදුසු කෙනකු
ලැබෙන තෙක්ය.

**නිමි.**

Visit http://www.sinhalamp3.com - for more sinhala e stories

# වැසිකිළි කුරුටු ලිපි

# නරලොව හොල්මන්

Copyright © by

**චන්ද්‍ර අනගිරත්න**

**1965 - 1967**



සීගිරි කුරුටු ගී ගැන දැන ගැනීමට ලැබීමෙන් විමතියටත් කුතුහලයටත් පත් වූ යුරෝපීය සහිත්‍ය ගවේෂකයෝ තිදෙනෙක් ලංකාවේ තවත් කුරුටු ලිපි ඇති තැන් සෙවීම සඳහා කොළඹ වරායෙන් ලංකාවට ගොඩබටහ. මේ කාර්‍යයේදී ඔවුන්ට සහායවීම සඳහා සුදුසුකම් ඇති එකම තැනැත්තා වශයෙන් රජයෙන් මා පත් කිරීම ගැටකපන්නන්ගේ සහ තැරැව්කාරයන්ගෙ දැඩි ශෝකයට හේතු විය. සීගිරිය, ශ්‍රීපාදය, පොළොන්නරුව ආදී ඓතිහාසික හා පූජනීය ස්ථාන කොළඹ නගරය තුලදීම පෙන්වා විදේශිකයන්ගේ ගමන් වෙහෙස අඩුකරන තැරැව්කාරයන්ගෙ අගනා සේවයට පහර ගසමින් මම මෙදා මෙම යුරෝපීය ගවේශකයන් තිදෙනා කොළඹ ජැටියේදී පිලිගෙන ගවේශණයට මුල පිරීමි.

ඔවුන් සමග ටික දුරක් ගිය මට වැසිකිලි යාමට අවශ්‍ය විය. ඔවුන් මහ මග නවතා ප්‍රසිද්ධ වැසිකිලියකට රිංගාගත් මට එයින් ආපසු එළියට ඒමේ දී සත්‍යය වසන් කිරීමට සිත් වුයේ වැසිකිලියකට යාම මදිකමක් ලෙස පිටස්තර ස්ථානවල දී සලකන සෑම සිංහලයෙකුටම හුරු පරිද්දෙනි.

"කොහෙද ගියේ?" විදේශිකයෝ ඇසුහ.

"කුරුටු ලිපි තියෙනවාද බලන්න."

"තිබුණද?" ඔවුහු හදිසි වුහ. මෙම හදිස්සිය වැසිකිලියට යාමට මට තිබු හදිස්සියටත් වඩා උග්‍ර විය. ඔවුන් මා ද පෙරලාගෙන වැසිකිලියට පැන ගත් නමුදු, නහයත් වසාගෙන එයින් එලියට පැන ගත්තේ ගිය වේගයට වඩා සැරෙනි.

කෙසේ වුව ද, කුරුටු ලිපි කියවීමේ ආශාව මෙයින් අත් නොහල ඔවුහු නහයත් කටත් වැසෙන සේ ලේන්සුවලින් මුහුණු බැඳගෙන මාත් සමග යළිත් වරක් එයට ඇතුලු වුහ.

ඔවුන්ගේ මුහුනු ප්‍රභාමත් වු හැටි මම කෙසේ විස්තර කරම් ද! ඔවුන්ට ඇති වු සන්තෝෂය, උද්‍යාගය හා නොඉවසිල්ල චන්ද්‍ර විමානෙට පළමුවේන්ම ගෙඩබට අයකුට වුවද ඇති නොවනු ඇත. ඔවුහු සටහන් පොත් අතට ගත්හ. කැමරා අතට ගත්හ. ශබ්ද පටිගත කරන යන්ත්‍ර ක්‍රියාත්මක කළහ. මට සිදු වුයේ සියල්ල විස්තර කිරීමය. අකුරෙන් අකුර පහදා දීමටය. රූපයෙන් රුපය කෙරෙහි ඔවුන්ගේ ඇස් යොමු කර සියල්ල තේරුම් කරදීමටය.

අපි තවත් වැසිකිලියට අතුළු වීමු. තවත් එකකට ඇතුළු වීමු. මේ අනුව දින ගණනක දී කොළඹ ඇති පෞද්ගලික හා පොදු වැසිකිලි ගණනක් අපේ ගවේෂණයට ලක් විය. අපි ලංකාව වටේම ගියෙමු. පූජනීය ස්ථාන, ගිමන්හල් , තානායම්. පාසල්, කන්තෝරු, සමාජශාලා, උසාවි, ආරෝග්‍යශාලා සහ මෙකී නොකී ආයතන සෑම එකකටම සම්බන්ධ වැසිකිලිවල පිටතින් හා ඇතුලතින් සොයාගත හැකි සෑම කුරුටු ලිපියක්ම අපි කියවීමු. සෑම රූප සටහනක්ම බලා රස වින්දෙමු. කෙසේ වුවද, ස්ත්‍රීන්ට පමණක් ඇති වැසිකිළිවලට යාමේදී කිහිප ස්ථානයකදීම අපි ස්ත්‍රී පක්ෂයෙන් නොසෑහෙන අන්දමට කොසු පහර කෑවේමු. අපි එයින් පසුබට නොවීමු. අමුම අමු තිත්ත කතාවෙන් බැනුම් ඇසුමට සිදු වු අවස්ථාවලදී ඒවායේ ඉංග්‍රීසි පරිවර්තනය මා විසින් අමුත්තන්ට සපයන ලද්දේ ඔවුන්ගේ සන්තෝෂයට හේතු වන පරිද්දෙනි.

වැසිකිලි කුරුටු ලිපිවල ඇති විශේෂ ලක්ෂණය වශයෙන් කුණුහරප වචනවල ඇති වටිනාකම සාහිත්‍යමය වශයෙන් අගය කිරීමට යාමේදී අපේ සාහිත්‍ය පොත් කීපයක්ම අපට උපකාරී විය. එහෙත් සාහිත්‍ය පොත් වල දක්නට ලැබෙන කුනුහරුපවලට වඩා වැසිකිලි බිත්තිවල කුණුහරුප ස්වාභාවිකත්වයෙන් හා මටසිලිටු භාවයෙන් අධ්‍යය. එ ඒ ශාරීරික වස්තූන් උදෙසා උපයෝගී කරගන්නා ලද සංකේතාත්මක වචනවල සරල සුගම ගතියත්, නිරවුල් අර්ථය පහදා දීමට තරම් එවායේ ඇති ජිවමය ගතියත් ගැන ගවේශකයන්ට පහදා දුන් මම වචනයකින් දෙකකින් හැඟීම් උද්දීපනය කිරීමේදී මෙම කුරුටු ලිපිවල ඇති වටිනාකම සවිස්තර ලෙස පෙන්වා දුනිමි.

වැසිකිලි බිත්තිවල කුරුටු ලිපි ලිවීමේදී සිංහල ලේඛකයා වැඩියෙන්ම උපයෝගී කර ඇත්තේ අඟුරු කෑලිය. පැන්සල් රටහුණු, තීන්ත සහ තාර ද සමහර අවස්ථාවන්හි දී ප්‍රයෝජනයට ගෙන ඇතත්. මෙම කාර්‍යයේ දී අඟුරු භාවිතය වැඩි බව අපිට පෙනී ගියෙන්, මෙම ලිපි සටහන් කිරීම  බෙහෙවින්ම උදය වරුවේහි සිදුවන බවට අපි නිගමනය කෙළෙමු. අනෙක් අතට, කලාකාමීන්ට හොඳ හොඳ අදහස් පහල වන උදය වරුවේහි, ශරීර කෘත්‍ය ද කලාවක් වෙයි. මෙම අවස්ථාවේදී වුව ද කාලය අපතේ නොහැර කලාත්මක නිබන්ධනයන්ගේ යේදීමට සිංහලයා
දක්වන සැලකිල්ල ගැන මෙම යුරෝපීය ගවේෂකයෝ පුදුම වූහ. සහෘදයාගේ පහත් පහන් සංවේගය උදෙසා සිය කලාකාමී හැඟීම් වචනයටත්, එයින් එහාට කවියටත් නගා එයින්ද නොසෑහී සිතියම් වලින් ඒවා හොඳින් පහදා දීමට ඔවුන් දක්වන උනන්දුව ගැන සතුට පළ කළ ගවේෂකයෝ, අපේ වැසිකිළිවල ඇති ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වටිනාකම ගැන මුළු ලෝකයටම දැනුම් දෙන බව ආඩම්බරයෙන් පවසා සිටියහ.

යමක් ඉදිරියේ දී සිතට නැගෙන අදහස් කුරුටු ලිපියකට පෙරලීමේදී රසිකයකුට ඇති වන නො ඉවසිල්ල ගැන මා අදහස් කලේ ඉතිහාසයට ද එබිකම් කරමිනි. ඊජිප්තුවේ අබු සිම්බල් කරා ගිය ග්‍රීකයන් රාමේසස් ගල් රූපයේ සිය නම් කෙටූ සැටිත්, 11 වැනි සහ 12 වැනි සියවස්වල සීගිරි කැටපත් පවුරේ සිංහලයන් රසවත් ගී ලිවූ සැටිත් මතක් කල මම, මෙම 20 සියවසෙහි වැසිකිලිවල කර ඇති සටහන් ඒ සියල්ලටම වඩා ශෘංගාරයෙන් පරිපූර්ණ බව ඔවුන්ට පහදා දුනිමි.

"සීගිරියේ නාරි රූපවල විවෘත උඩුකය දැකීමේ දී හැඟීම් පහල වීම නිසා එ අය එදා එ හැඟීම් කවියට නගන්නට ඇති. අනිත් අතට, සීගිරියේ කැටපත් පවුර ඒ සඳහා හොඳට ඉඩකඩ ඇති තැනක්. ස්ථානයත් සුන්දරයි." ඒක් ගවේෂකයෙක් කීවේය.

"ඇත්ත නමුත් වැසිකිලියක දී ඇති වන්නේ පිලිකුල් ගතියක්. එය ප්‍රියංකර ස්ථානයක් නොවේ. එහෙම තිබියදීත්, අපේ නවීන රසිකයා එක එල්ලේ ම ශෘංගාරය මවන හැටි පුදුම නැද්ද?
ඔවුන්ගේ රූප විවෘත උඩු කයට පමණක් සීමා වෙලා නැහැ?
ඔවුන්ගේ අකුරු සීගිරි ගලේ මෙන් කුඩා නොපැහැදිලි ඒවා නොවේ. පොල්ගෙඩි ප්‍රමාණයේ ඒවා.එච්චර විතරක් නොවේ. වැසිකිලිවල ඇතුල් බිත්තිවලත් පිට බිත්තිවලත් සටහන් තබන අපේ රසිකයා එයින් සෑහීමට පත් වන්නේ නැතිව, මහ පාරේ, තාප්පවල, දුම්රිය මැදිරිවල, බස්වල, බංකුවල, ගස්වල, ඒ වාගේම ලියන්න පුලුවන් අඳින්න පුලුවන් ඕනෑ ම තැනක සටහන් තබනවා" මම උත්තර දුනිමි.

"සිංහලයාගේ කලා රුචිකත්වය අපූරුයි! අසමසමයි!"
ගවේශකයෝ එක හඬින් පැවසූහ.

"හොඳයි, මේ කුරුටු ලිපි ආරක්ෂා කරීමට අණ්ඩුවෙන්, පලාත් පාලන ආයතන වලින් - එතකොට මහජනයාගෙන් සහයෝගය ලැබෙනවා ද?"

"ඔව්, මේ වැසිකිලි බිත්තිවල කවදාවත් හුණු ගාන්නේ නැත්තේ ඒවා මැකෙන හින්දා. එතකොට, මේ වැසිකිලිවල වතුර සපයල නැත්තේ, ඒවා මැකීමට ප්‍රයෝජනයට ගනී කියලා. අනිත් අතට, මේ වැසිකිලි පිරිසිදු කරන්නේ නැත්තේ මහජනයාගේ පැමිණීම වලක්වා ඒවා ආරක්ෂා කිරීමට." මම උත්තර දුන්නෙමි.

"අපූරුයි! අපූරුයි!!" ඔවුහු පැවසූහ "හොඳයි එතකොට කුරුටු ගී ලිවීම දියුනු කිරීම සඳහා - එතකොට ඒ සඳහා මහජනයා උනන්දු කිරීමට යම්කිසි පියවරක් ඇරන් තියෙනවා ද?"

"මොකද නැත්තේ?" මම උත්තර දුන්නෙමි. "ලංකාවේ කඩදාසි හිගයි. තිබුනත් මිල අධිකයි. එතකොට, අපේ මිනිස්සු කඩදාසිවල ලියන්නේ නැතිව, වැසිකිලි බිත්තිවලයි, අනෙක් ප්‍රසිද්ධ ස්ථානවලයි
ලියන්න ඉබේම පෙළඹෙනවා. එයින් මේ කුරුටු ගී කලාව දියුණු වෙනවා"

"ඕ - ඕ - ඇත්තමයි අපූරුයි! කුරුටු ගී කලාවට ලැබෙන සහයෝගය ඇත්තෙන්ම මහත් උත්කෘෂ්ඨයි!" කියා සතුට පල කල ගවේෂකයෝ, "කුරුටු ගී ක්‍රමය අනුගමනය කිරීමේදී සිංහලයා අතින් රටට සේවයක් වේනවාද?" කියා මගෙන් ඇසූහ.

"මොකද නැත්තේ." මම එක හඬින් ප්‍රකාශ කෙළෙමි.
"ලංකාවේ ගොඩනැගිලි සෑදීම රජයෙන් හෝ කොන්ත්‍රාත්කරුවන් අතින් හෝ සිදුවන්නක්. නමුත් ඒවායේ හුණු ගෑම කෙරෙන්නේ කුරුටු ගී කලාව අනුගමනය කර බුලත් විට හපන මහජනයාගේ ඇඟිල්ලෙන්."

සිංහලයා ගේ කලා රචිකත්වය ගැනත්, එයින් රටටත් සමාජයටත් වන උදාර සේවය ගැනත් නොසෑහෙන අන්දමට සෑහීමට පත් වු ගවේෂකයෝ යළිත් කිසි දිනෙක මෙහි නොඑන්නට සිතා මහත් සන්තෝෂයෙන් ලංකාවේන් පිටවුහ.

**නිමි.**

Visit http://www.sinhalamp3.com - for more sinhala e stories

## යම රජු හමුව

# නරලොව හොල්මන්

Copyright © by

චන්ද්‍ර අනගිරත්න

1965 - 1967



IGCAS www.sinhalamp3.com e Story Book's

නෛතිකශ්‍රීයෙන් විරාජමාන වූ සතර අපායට අධිපති ශ්‍රීමත් යම රාජෝත්තමයන් වහන්සේගේ ශ්‍රී ලංකා රාජ්‍ය චාරිකාව සඳහා මෙතෙක් කිසිම රාජ්‍ය නායකයකු පිළිගැනීම සඳහා නොකරන ලද වියදමක් දරා, කිසිම රාජ්‍ය නායකයකුට නොදක්වන ලද රාජ්‍ය ගෞරව දැක්වීමට කටයුතු නියමිත වූ දිනට පෙර දින රාත්‍රියේ මා නින්දට ගියේ එතුමාගේ ශ්‍රී ලංකා රාජ්‍ය චාරිකාව භාර පාපකර්ම අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති උත්තරීතර වගකීමෙන් බරින් පිරී ඇති හිසේ පෙර කිසි දිනක ඇති නොවූ රුදාවකින් යුතුවය.

එහෙත් මට හොඳින් නින්ද ගියේය. ඊට හේතුව මගේ බිරිඳ අසනීප නිවාඩු මත ගමේ ගොස් සිටි නිසාය.

මැදියම් රැයේදී මා හදිසියෙන්ම අවදි වූයේ භූමිකම්පාවක් වැනි කිසියම් සෙලවීමකින් මගේ ඇඳ ඉස්සී මාත් සමග පැත්තට පෙරලීම නිසාය. මම ඇඳට යට වීමි. ඉබේම මෙන් ඇඳ යලිත් තිබුණු අන්දමටම පෙරලී පතිත වූ පසු මම නැගිට ගත්තෙමි.

මුළු කාමරයම පබාවතී කුමරිය උන් කාමරය මෙන් මහත් ආලෝකයයෙන් බැබලිමින් තිබුණි. ඒ ආලෝකය මැද සිට ගෙන මා දෙස සිනාමුසු මුහුණින් බලා සිටි පුද්ගලයා මට යන්තමින් හඳුනා ගැනීමට හැකි විය.

"යම රාජෝත්තමයන් වහන්සේ ?" මට ඉබේම ඇසිනි.

"ඔබ වහන්සේ මෙහෙම?"

"ඔය වහන්සේ කෑල්ල අත්ඇරලා දාලා පහසු විදියට ආමන්ත්‍රණය කරන්න යාලුවා!"

"ඔබ වහන්සේ ඇයි මෙහෙම කිසිම දැනුම් දීමකින් නැතිව මේ විදියට මගේ කාමරයෙන් මතු වුනේ? අපි බලාපොරොත්තු වුණේ ඔබ තුමා අපේ මහා වරායෙන් හරි, මහා ගුවන්තොටුපලෙන් හරි සම්ප්‍රාප්ත වෙයි කියල එහෙදි පිලිගන්නයි"

"තමුසෙලා අපායට එනකොට එන්නේ ප්ලේන් එකෙන්ද , නැවෙන් ද? නෑ - පොළොව පලාගෙනයි අපායට එන්නේ. එහෙම තිබියදී මං ප්ලේන් එකෙන් හරි, නැවේන් හරි තමුසෙලෑ රටට ගොඩබසීවි කියල හිතන එක කොච්චර මෝඩකමක්ද? මමත් පොළොව පලාගෙන උඩට මතුවුණා"

"මගෙ ඇඳත් පෙරළාගෙන?"

"ඔව්"

"හොඳ වේලාවට මගෙ මිසිස් ගෙදර හිටියේ නෑ."

"මං දන්නවා ඒක. ඒක හින්දා තමා මේ වේලාවෙම උඩට මතු උණේ. හිටිය වේලාවක නම් කීයයි කීවත් තමුසෙගෙ කාමරයෙන උඩට මතු වෙන්නේ නෑ."

"ඇයි ඔබ තුමා ඔච්චර ගෞරවයක් දක්වනවද භාර්යාවන්ට?"

"ගෞරවයක් නෙමේ ඔයි! ඒක අතකින් බය! අනෙක් අතට මට උං එපා වෙලා ඉන්නේ. මේ දැන් උනත් මං යම ලොවින් පැන ගත්තේ, තමුසෙගෙ මිසිස් වගෙ මගෙ මිසිසුත් නැන්දම්මලෑ දිහා පිටත් කරලා."

"අපේ නැන්දම්මලාගේ දිහා?"

"තමුසෙල නැන්දම්මලෑ දිහා නෙමේ ඔයි - අපෙ නැන්දම්මලෑ දිහා දෙන්නම එක නොවුණාට - එක වාගෙ තමා."

"නමුත් මෙහෙම රාජ්‍ය චාරිකාවක යෙදෙන කොට තමන්ගේ භාර්යාවන්, නෑදෑයින් , හිත මිත්‍රාදීන් සහ කිට්ටු උසස් නිලධාරීන් කැටුව පැමිණීම තමා සාමාන්‍යයෙන් කෙරෙන රාජ්‍ය තාන්ත්‍රික චාරිත්‍රය."

"උන් තමා ඕයි අපිව කන්නෙ. යම ලෝකයේ පාලන කටයුතු මම බොහොම අමාරුවෙන් ගෙනියන්නෙ මගෙ ගෑනිගෙ කන්දොස් කිරියාවයි ඇඟිලි ගැහීමයි හින්දයි රටත් වෑඩිය එයාගෙ නෑදෑයන් පිනවන්න ගිහිල්ලයි, ලොකු නිලධාරීන් කොලේ වහල අපාය දිව්‍යලෝකයක් කරල මගෙ මූණ හොඳ කරන්න යන හින්දයි."

"නමුත් අපි කටයුතු සූදානම් කරලයි තියෙන්නෙ ගොඩක් පිලිගන්න."

"තමුසෙලෑයි රට දුප්පත් රටක්! මං තිහක් හතලියක් පිරිවරාගෙන ආවාම තමුසෙලෑයි රටට මොන වියදමක් ද? කරදරයක් ද? වැඩිය උන් එන්නෙ ජොලියෙ! නමුත් ආරාධනාව මටයි මිත්‍ර රටක නායකයකු වශයෙන් තමුසෙලාගෙ අරාධනාව පිට මං එන්නෙ, දෙරට පිලිබඳ

නියම අවබෝධයක් ඇති කර දෙරටේ ප්‍රශ්න සාකච්චා කරලා, දෙරටවාසීන්ට සෙතක් සලසන්නයි."

"ඔබතුමා පමණක් උනත් නියම පූර්ණ රාජ්‍ය ගෞරව දක්වලා පිලිඇරගෙන - "

"හා - හඃ හඃ හා!" යම රජ හිස අල්ලාගෙන සිනාසුණේය. "හු - හුඃ හුඃ හූ!" ඔහු බඩ අල්ලාගෙන සිනාසුණේය. "හී - හිඃ හිඃ හිඃ!" ඔහු පස්ස පැත්ත අල්ලාගෙන සිනාසුනේය.

"ඇයි, යම රජ තුමනි!"

"රුපියල් ලක්ෂ ගණන් වියදම් කරලා, වීදි දෙපස සරසල, තොරන් ගහලා, ඉස්කෝලේ ළමයි අතර කොඩි දීලා, පාර දෙපස හිටවලා, නිලධාරීන් දහස් ගණනක් යොදවලා, දින ගණනක් මා වේනුවේන් වැඩ කරන්න, ත්‍රිවිධ හමුදාවයි පොලීසියයි මා වේනුවෙන් යොදවලා, ගුවන්තොටුපලේදී මහා හර සරින් පිලිගෙන, රාජ්‍ය භෝජන සංග්‍රහ පවත්වලා, ලොකු ලොකු අය හඳුන්වලා දීලා, දහස් ගනණකගෙ අතට අත දීලා, බොරුවට ඒ අයට හිනාමුසු මුහුනක් පෙන්නන්න මට ඉඩ සලස්සලා මගේ ගමන මහා චාතයක් කරන්නයි තමුසෙලා ඔය හදන්නේ. මම කැමති නෑ ඔය වෙන රාජ්‍ය නායකයෝ වගේ බොරූ සෝබනේට. මිත්‍ර රටක මිත්‍ර රාජ්‍ය නායකයකු පිලිගනන ඕනෙ මිත්‍ර ලීලාවෙන් -

කොහොමද මචං සැප සනීප! වරෙං අඩියක් ගහන්න. යමුද අර පැත්තේ රවුමක් ගහන්න? මොකක්ද මගෙන් තමුසෙලට කෙරෙන්න ඕනෙ. තමුසෙ මට මොනවද ගෙනාවේ. ආන්න ඔහොමයි - ඒහෙම නැතුව ඔය බෑං චුං - අචාර වෙඩිමුර මට ඕනෙ නෑ! හරි දැං කතා කර කර හිටිය ඇති - අපි යං!"

"වැඩ සටහනේ හැටියට - මහ නගර සභා පිලිගැනීම, මහ නුවර, සීගිරිය, අනුරාධපුරය, පොළොන්නරු චාරිකාව - ඊළඟට මහා නදී තදියම් ව්‍යාපාරය නැරබීම එ ඒ වේලාවට කෙරෙන්න ඕනෑ යමරජතුමනි!"

"බම්බු වැඩසටහන! ඇඳගන්නවා හොඳ සරමකුයි කමිසෙකුයි. මටත් දෙනවා තමුසෙගෙ සරමකුයි කමිසෙකුයි - නැතුව මෙහෙම නිර්වස්තරේ ගියොත් තමුසෙල මිනිස්සු හිතයි මං සුර දූතයෙක් කියලා!"

"අපට යන්න තියෙන්නේ වැදගත් තැන්වලට යමරජතුමනි!" මම හරස් විමි.

මගේ ආරාධනය පරිදි ආ යමරජු රාජ්‍යතාන්ත්‍රික ක්‍රමයට නම් මා කියන පරිදි කටයුතු කළ යුතු නමුදු මට සිදුවුයේ ඔහුගේ කීම අනුව කටයුතු කිරීමටය. මේ වගේ පිලිගැනීමක් කොයි රටක හෝ සිදු වේ දැයි මම නොදනිමි. මම ඔහුට අවනත විමි.

පහන් වීමට පෙර මහ නගරයට වන් අපි අහුමුලුවල නිදා උන් ජරා ජීර්ණ පුද්ගලයන් නැරබීමු. ඔවුන්ගෙ චායා රූප ගැන්මට යමරජුට නොහැකි වුයේ බොහෝ දෙනෙකුගෙ ඇදුම් එහෙ මෙහෙ වී තිබු නිසාය. පහන් වී ගෙන එද්දී මුඩුක්කු වලින් එලියට එමින් සිටි පුද්ගලයන්ද, මහා මාර්ගයේ හා කාණුවල වාඩි වී දිනයේ මුලික කෘතයේ සිටි ලමයින් ද, පොදු පයිප්පය ලග ස්තෝත්‍ර හා ප්‍රශස්ති ගායනයේ යෙදුනු කාන්තාවන් ද දුටු රජතුමා අමන්දානන්දයට පත්වුහ.

තොටලග මඩ ගොහුරු උඩින්, මුඩුක්කු හරහා ගොස් කොස්ගස් හන්දිය, දෙමටගොඩ, වනාතමුල්ල, පංචිකාවත්ත, කොම්පඤ්ඤවීදිය, මාළු කඩේ, සෝන්ඩර්ස් පෙදෙස හා සපිරිනා මුඩුක්කුව තුලින් ලංකාවේ නූතන ශ්‍රී විභූතිය දුටු එතුමා මේ හැම තැනකදීම ජායා රූප ගත්තේ ඒවා ගෙන ගොස් ඒ අනුව අපාය දියුනු කිරීමේ අදිටනිනි.

බෝහෝ තැනවලදී ගංජා , අබින්, කසිප්පු, ගණිකාවන් හා හොර බඩු සැපයීමට ඉදිරිපත් වු ගණන්කාරයන්ගේ ආගන්තුක සත්කාරය ගැන එතුමා මවිත විය. හිමිදිරියේ මාළු කඩයකට ඇතුල් වී රාජ්‍ය ගෞරව ලැබු එතුමා, අපායටත් වඩා දියුනු ප්‍රදේශයක එළවුළු වෙළඳපොල සාර්ථක ලෙස පවත්වා ගෙන යාම ගැන සැලකිල්ලක් දැක්වීය.

බස් පෝලිම් වල ප්‍රීතියෙන් උන් ජනතාව සමග සතුට බෙදාගත් එතුමා කිටි කිටියේ තදවී බසයක නැගී යාමට කැමැත්ත පල කලේය. හෝල්ටිං ප්ලේස් දෙකක් පසුවු පසු "මගේ පොකට් එකට කව්දෝ ඇන්නෝ!" යයි ඔහු ප්‍රීතිඝෝෂා පැවැත්වීය. ඊලග හෝල්ට් එකෙං බැස්ස යමරජු ප්‍රකෘති තත්වයට පත්ව සිටි බැවින්, ලගම වු සාප්පුවකින් අලුත් සරමක් ඇරන් දීමට මට සිදු විය.

යම රජ තුමා ඉතාමත් ප්‍රීතියටපත් වුයේ කන්තෝරු කෝච්චියක නැගී පාපුරුවේ කප්ලිං දෙකක් මත සහ වහලයේ නැගී ගමන් කිරීමේදීය. එවැනි විනෝදජනක ගමනක් ජම්බෝ ජෙට් එකක පළමුවැනි පන්තියේ ගමන්කිරීමෙදි හෝ තමාට නොලැබුනු බව එතුමා

අවධාරණයෙන්ම පැවසීය. අපායට යන ලාංකිකයන් කටුඉබුල් ගසේ ඉහල පහල යද්දීත් සිනා සෙන්නේ මන්දැයි තමාට තේරුනේ මෙදා බව එතුමා කීහ.

මහ නගරයේ පදික වේදිකාවක් දිගේ ගමන් කිරීමට ගොස් ගණන්කාරයන්ගේ රාජ්‍ය සැලකුම් ලැබූ එතුමා ඒ වෙහෙස යන්නත් එක්ක අඩියක් ගැසීමට කැමති විය. පිළිවෙළින් රා ද , ගල් ද , පොල් ද ,ගසා "ඕක්" යනුවෙන් ප්‍රීතිය පළ කල එතුමා අපායට යන ලාංකිකයින් කටට ලෝදිය වක්කරද්දී තව තවත් ඉල්ලන්නේ මන්දැයි වටහා ගත්තේය.

මහ නගරයේ තැරුවිකාරයන්, මගඩි කාරයන් , විනිමය කාක්කන් , අල්ලස් මස්තාන්වරුන්, හොර බඩු ජාවාරම් කාරයන්, මස් කඩ කාරයන් හා කප්පන් කාරයන් සමග දිවා භෝජන සංග්‍රහයට සහභාගි වූ එතුමා , කොතෙක් මහජන විරෝධය නැග ආවත් ඒ සියල්ල මැඩ ගෙන ඔවුන් රටට කරන සේවය උත්කෘෂ්ඨ බවත් පැවසීය.

රාජ්‍ය දෙපාර්තුමේන්තු සහ සංස්ථාවල කෙරෙන වංචා හා දූෂණ පිලිබඳවද, ඒ ඒ අංශවල අකාර්යක්ෂමතාවයන් , විනාශකාරී කටයුතු හා නාස්තිය පිලිබඳවද දැන ගත් එතුමා මේවා හැදෑරීම සඳහා විශේෂ යම පල්ලන් පිරිසක් මෙ රටට එවීමට සනිටුහන් කර ගත්තේය.

ආරෝග්‍යශාලාවල ලෙඩුන් බැලු එතුමා ලාංකිකයන් පවි කිරීමෙන් පසු අපායට ඒම මහත් විහිලුවක් බව ප්‍රකාශ කළේය.

රජතුමා මහපාර මැද විශාල වලක වැටී ආපසු අපාය බලා යන ගමන්, "උබලෑ රටේ වැරදි කරන එවුන් හදන්න ආධාර වශයෙන් යමපල්ලන් එවනනං මචෝ!" යයි කියමිනි.

**නිමි.**

Visit http://www.sinhalamp3.com - for more sinhala e stories